# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,847 — 1969 මාර්තු 28 වැනි සිකුරාද — 1969.3.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... | 479, 512 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 496 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 499 | රට කීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 510 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 511 | විවිධ දැන්වීම ... ... ... | 512 |


## තනතුරු — ඇබෑර්තු — (512 වැනි පිටුවද බලන්න)

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික පරීක්‍ෂා සේවා කාල පරිච්ඡෙදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්‍ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණ, නියමිත කාල පරිච්ඡෙදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡෙදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්‍ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්‍ෂා සේවා කාල පරිච්ඡෙදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්‍ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්‍ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නොවන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය හිමි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්‍ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ ඇතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡෙදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එතෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරනලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු ඒම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්‍ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්‍ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්‍ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්‍ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්‍ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතු වෙන්ම ඒ අපේක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

මගේ අංකය : සාප/5/151

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ග්‍රහලෝකාගාරයේ ශිල්පී තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති ග්‍රහලෝකාගාරයේ ශිල්පී තනතුරක් සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 අප්‍රේල් මස 18 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) සහිර ලේකමට ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) තනතුර සහිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය ;

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්‍ෂා කාල සීමාව අවුරුදු 3ක් වන්නේ ය ;

(iii) රජයේ සේවයේ සහිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ තත්ත්වයේ පවතිනු ඇත ;

(iv) කාර්යක්‍ෂමතා කඩඉම් : තනතුරෙහි සහිර කරනු ලැබූ දින සිට දෙවර්ෂයක් ඇතුළතදී, සිංහල භාෂා විෂයයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ නියමිත කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයකින් සමත් විය යුතුය. මෙම විභාගයෙන් සමත් වීමට අපොහොසත් වීම වැටුප් වැඩිවීම විලම්බනය කිරීමට හේතු වේ ;

(v) සේවයේ සහිර කිරීමට පෙර සිය වැඩ පිළිබඳ පරීක්‍ෂණයකින් සමත් විය යුතුය.

3. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 1,020 වැටුපක සිට රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 15න් රු. 2,820 ක වාර්ෂික වැටුපක් තෙක් වැඩිවන වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අයත් ය.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි :—

(අ) සෑම අයදුම්කරුවෙක්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ එම අමාත්‍යාංශය යටතේ ඇති පහත සඳහන් දෙපාර්තමේන්තු හා ආයතන යටතේ හෝ සේවය කරන්නෙකු විය යුතුය :—

ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තු

විභාග දෙපාර්තමේන්තුව

පුරා විද්‍යා දෙපාර්තමේන්තුව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

අධ්‍යාපක ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනය

මරදානේ ලංකා කාර්මික විද්‍යාලය

අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනය

කණිෂ්ඨ කාර්මික ආයතන

කණිෂ්ඨ විශ්ව විද්‍යාලයයන්.

(ආ) ඉල්ලුම්පත් බාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 17 ට වැඩි සහ අවුරුදු 25 ට අඩුවිය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්තවූවන් සඳහා උපරිම වයස් සීමාව නොයෙදේ.

(ඈ) භෞතික විද්‍යාව ඇතුළු විද්‍යා විෂයයන් තුනක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සමාන විභාගයකින් හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී භෞතික විද්‍යාව සහිත විද්‍යා විෂයයන් තුනක් ඇතුළුව විෂයයන් හයකින් පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ පිළිගත් සමාන විභාගයකින් හෝ

උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුයි.

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ ඉංජිනේරු පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම හෝ

සියුම් විදුලි උපකරණ අළුත් වැඩියා කිරීම හා නඩත්තු කිරීම කෙරෙහි පිළිගත් වෙළඳ ආයතනයක කාර්මික අංශයේ හෝ එවැනි රජයේ වෙනත් දෙපාර්තමේන්තුවක ඒ හා සමාන සේවය කර දෙවර්ෂයක පළපුරුද්දක් තිබිය යුතුයි.

**සංලක්ෂ්‍යය :** දෘශ්‍ය උපකරණ නඩත්තු කිරීම හා ඒවා ක්‍රියා කරවීමේ පළපුරුද්ද හා දැනුම ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත. ඉහත (අ) යටතේ සඳහන් විද්‍යා විෂයයන් සංඛ්‍යාවට ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය හා උසස් ගණිතය ද ඇතුළත් වේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක් ම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය

(ආ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික

(ඇ) 4 වැනි ඡේදයේ (ඇ) අනු ඡේදය යටතේ සඳහන් වන පිළිගත් ආයතනයන්හි පූර්ව සේවය පිළිබඳ සහතික

(ඈ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත් වූ ඉහළම විභාගය දක්වෙන සහතිකය සටහන—

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා **නොඑවිය** යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් බාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම්පත් බාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ඇතුළත ඉල්ලුම්පත ලැබුණ බවට ලිපියක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මාර්තු මස 21 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදී ය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**ග්‍රහලෝකාගාරයේ ශිල්පී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි**

(සප/5/151)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :————, උපන් දිනය :————.

5. උපන් ස්ථානය—

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.

(i) සාමාන්‍ය :—(ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයේ හෝ අ. පො. ස. සහතික පත්‍රයේ හෝ උසස් විභාගයක හෝ විස්තර, වර්ෂය විෂයයන් හා සාමාර්ථ මට්ටම සඳහන් කළ යුතුයි)

(ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.

(iii) සිංහලෙන්/දෙමළෙන් සමත්වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.

8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඇ) අනු ඡේදය යටතේ සේවා විස්තර :————.
(සේවය කළ ආයතන, සේවා කාලයන්, දැරූ තනතුර සඳහන් කළ යුතුයි.)

9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

11. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර :————.

13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා—

(i) දරන ලද තනතුර :————.

(ii) නියුක්තව සිටි වකවානුව :————.

(iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්,

(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.

(ආ) සේවයේ යෙදී සිටි කාලය :————.

(ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව—

(i) ආයතනය :————.

(ii) තනතුර හා ශ්‍රේණිය :————.

(iii) ඊට පත්වූ දිනය :————.

(iv) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ?

(v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :————.

18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබී මට පළමු සොයා ගනු ලැබුව හොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුව හොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

මගේ අංකය :

ඔබේ අංකය : සාප/5/151.

අධ්‍යා. සං./ලේ.

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය. *

ඉල්ලුම් පත්‍රයේ සඳහන්.......................අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව් * මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය
පදවි නාමය :————

දිනය :————.

(* අදාළ නැති කොටස් කපා හරින්න.)

3–1255—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### උපාධිධාරි උපගුරු තනතුරු

දිස්ත්‍රික් ගුරු සේවා ක්‍රමය යටතේ පහත සඳහන් දිස්ත්‍රික්කවල පිහිටි රජයේ මහා විද්‍යාලවල උපාධිධාරි උපගුරු පුරප්පාඩු සඳහා ගැහැණු සහ පිරිමි උපාධිධාරි ලාංකිකයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමට 1968 ජූලි මස 5 දින හා අංක 14,809 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනය මෙයින් අවලංගු කෙරෙන අතර, ඒ අනුව අයදුම්පත් එවා ඇති **අයදුම්කරුවන් ද මෙම තනතුරු අපේක්ෂා කරන්නේ නම් මෙම නිවේදනය යටතේ අයදුම්පත් එවිය යුතුය.**

3. මෙහි පහත දක්වෙන ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1969 අප්‍රියෙල් මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙනසේ " කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් (පාඨශාලා පරිපාලන ශාඛාව) " කියා බහා එවන කවරයේ සඳහන් කර ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. තවද, එම කවරයේ ඉහළ වම් කෙළවරෙහි " උපාධිධාරි උපගුරු තනතුරු " යන්නද පැහැදිලිව සඳහන් කළ යුතුය.

උපාධිධාරි උපගුරු පත්වීමක් අපේක්ෂාවෙන් එවනු ලබන අයදුම් පත්‍රයේ 13 වැනි ඡේදය සම්පූර්ණ කිරීමේ දී, පත්වීමක් දුනහොත් තමා සේවය කිරීමට කැමති දිස්ත්‍රික්ක **පහක්** කැමැත්තේ අනු පිළිවෙලට සඳහන් කළ යුතුය. පහත සඳහන් දිස්ත්‍රික්ක අතුරින් ඕනෑම පහක් පමණක් තෝරා ගත යුතුය.

**උපාධිධාරීන් සඳහා පුරප්පාඩු ඇති (සිංහල මාධ්‍ය) මහා විද්‍යාල පිහිටා ඇති දිස්ත්‍රික්ක.**—වවුනියා දිස්ත්‍රික්කය, යාපනය දිස්ත්‍රික්කය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, මඩකලපුව දිස්ත්‍රික්කය, අම්පාර දිස්ත්‍රික්කය, අක්කරෙයිපත්තු දිස්ත්‍රික්කය, නුවරඑළිය දිස්ත්‍රික්කය, හම්බන්තොට දිස්ත්‍රික්කය, මොණරාගල දිස්ත්‍රික්කය, බදුල්ල දිස්ත්‍රික්කය, අනුරාධපුර දිස්ත්‍රික්කය, පොළොන්නරු දිස්ත්‍රික්කය, කුරුණෑගල දිස්ත්‍රික්කය, හලාවත දිස්ත්‍රික්කය, පුත්තලම දිස්ත්‍රික්කය, කෑගල්ල දිස්ත්‍රික්කය.

**උපාධිධාරීන් සඳහා පුරප්පාඩු ඇති (දෙමළ මාධ්‍ය) මහා විද්‍යාල පිහිටා ඇති දිස්ත්‍රික්ක .**—හම්බන්තොට දිස්ත්‍රික්කය, මාතර දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය, රත්නපුර දිස්ත්‍රික්කය, කෑගල්ල දිස්ත්‍රික්කය, නුවරඑළිය දිස්ත්‍රික්කය, මාතලේ දිස්ත්‍රික්කය, මොණරාගල දිස්ත්‍රික්කය, බදුල්ල දිස්ත්‍රික්කය, කුරුණෑගල දිස්ත්‍රික්කය, පුත්තලම දිස්ත්‍රික්කය, අක්කරෙයි පත්තු දිස්ත්‍රික්කය, මඩකලපුව දිස්ත්‍රික්කය, අම්පාර දිස්ත්‍රික්කය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

4. පත්වීමක් දීම සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවෙකු පත්වීම් දෙනු ලබන දිස්ත්‍රික්කයේ සේවය කරන බවටත්, එම දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවක් ඉල්ලුම් නොකරන බවටත් ප්‍රථමයෙන්ම ගිවිසුමකට අත්සන් කළ යුතුය. එහෙත් පත්වීමක් දෙනු ලැබූ අයකු සේවයේ අවශ්‍යතාවයන් හෝ පරිපාලනමය වූ අන්‍ය හේතූන් හෝ උඩ වෙනත් දිස්ත්‍රික්කයකට මාරු කර යැවීමේ බලය දෙපාර්තමේන්තුව සතුව පවතිනු ඇත.

5. **වැටුප් සහ දීමනා.**—පළමුවෙනි හෝ දෙවැනි පංතියේ ගෞරව උපාධිධරයන් සඳහා: **වර්ෂයකට රු. 3,180—10 × 120, 7 × 180—5,640.** සෙසු උපාධිධරයන් සඳහා : **වර්ෂයකට රු. 2,700—10 × 120, 7 × 180—5,160.** ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව හා ගෙවල් කුලී දීමනාව නියම ප්‍රමාණයන්ට අනුව ගෙවනු ලැබේ.

6. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1969 අප්‍රියෙල් මස 20 දිනට වයස අවුරුදු 22 ට අඩු හෝ 45 ට වැඩි හෝ නොවන බව. උපරිම වයස් සීමාව දැනට රජයේ පාසල්වල සේවය කරන ස්ථිර ගුරු භවතුන්ට හා රජයේ අනිකුත් ස්ථිර සේවකයින් කෙරෙහි බලපාන්නේ නැත.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරයකු වීම. උපාධිය සඳහා හදාරා ඇති විෂයයන් සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උසස් පෙළ) පංතිවලට ඉගැන්වීම සඳහා ප්‍රවීණත්වයක් තිබිය යුතුය. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ හෝ ඊට උසස් විභාගයකදී සිංහල/දෙමළ භාෂාව නමැති විෂයයෙන් සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඉ) විශිෂ්ඨ චරිත ශුද්ධියකින් යුක්ත බව.

(ඊ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති බව හා ඊට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

(උ) ලංකාවේ පුරවැසියෙකු බව.

7. **බඳවා ගැනීමේ කොන්දේසිය :**

(i) මෙම තනතුරු ස්ථිර ය.

(ii) මෙම තනතුරු ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිතය.

(iii) පත්වීම සඳහා තෝරා ගනු ලබන්නා විශ්‍රාම වැටුප් සඳහා ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමයට සහ ගුරුවරුන්ගේ වැන්දඹු හා විශ්‍රාම වැටුප් අරමුදලට ආයක මුදල් ගෙවිය යුතුය.

(iv) ආධුනික කාල සීමාව අවුරුදු 3 ක් වේ.

(v) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද විශේෂයෙන් ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධානයන් ක්‍රියාවේ යෙදවීම උදෙසාද සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන යම් යම් ව්‍යවස්ථාවනට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(vi) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හා රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

(vii) ඉහත (iv) වෙනි ඡේදයේ සඳහන් අවුරුදු 3 ක ආධුනික කාල සීමාව තුළ දී පහත සඳහන් කොන්දේසි මත සේවය කළ යුතුයි :—

(අ) පළමුවන අවුරුදු දෙක ඇතුළත දී විදුහල්පතිවරුන් දෙදෙනෙකු යටතේ සේවය කළ යුතුය.

(ආ) යථෝක්ත විදුහල්පතිවරුන්ගේ වාර්තා හා පොදු සමීක්ෂණ වාර්තා ආදිය සතුටුදායක නම් අවුරුදු දෙක අවසානයේදී පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකින් පසු තුන් අවුරුදු සේවය සම්පූර්ණ වූ විට ස්ථිර පත්වීම් දෙනු ලැබේ.

8. පහත සඳහන් ලියකියවිලිවලින් කීපයක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටි විටක, අයදුම්කරුවන් විසින් ඒවා ඉදිරිපත් කළ යුතු වේ :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) ලබාගත් උසස්ම ශාස්ත්‍රීය සුදුසුකම පිළිබඳ සහතික පත්‍රය සහ සිංහල/දෙමළ භාෂාවෙන් සාමාර්ථය ලත් උසස් ම විභාග සහතික පත්‍රය.

(ඉ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්. ඉන් එකක් තමා පදිංචි කොට්ඨාශයේ ග්‍රාම සේවකගේ සහතිකයක් මත වූ ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන නිකුත් කළ සහතිකයක් විය යුතුය.

**සංලක්ෂ්‍යය :** (i) ඉහත සඳහන් ලියවිලි හෝ ඒවායේ පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතු නොවේ.

**සංලක්ෂ්‍යය :** (ii) අවශ්‍ය වූ විට ඉහත සඳහන් ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නො ලැබේ.

9. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ද සංස්ථාවක නියුක්ත සේවකයින් අයදුම්පත් එම සංස්ථාවේ ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

10. අයදුම්පත් හා ඒ පිළිබඳ වෙනත් ලිපි ඉහත 3 වැනි ඡේදයේ සඳහන් පරිදි එවිය යුතු අතර මෙම අමාත්‍යාංශයේ නිලධාරියකු නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

11. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි වෙත අවධානය යොමු කරවනු ලැබේ.

12. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළි ගනු නො ලැබේ.

13. තැපෑලේදී සිදුවිය හැකි ප්‍රමාදයන් මග හැරවීම සඳහා සිය අයදුම්පත් කල්වේලා ඇතිව ලේඛණගත තැපෑලෙන් එවන ලෙස අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

සී. ජී. දයාරත්න,
අධ්‍යාපන හා සංස්කෘතික ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

පාප. 12/235.
1969 මාර්තු 21 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**උපාධිධර උපගුරු තනතුරු සඳහා අයදුම්පත්‍රය—සිංහල/දෙමළ මධ්‍ය පාසල්**

1. සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමග) (පැහැදිලි අකුරෙන්).

2. ලිපිනය :————.

3. විවාහක ද අවිවාහක ද යන බව :————. ස්ත්‍රී පුරුෂ භාවය : ————.

4. අයදුම්කරු රජයේ සේවකයෙකු හෝ සංස්ථාවක සේවකයකු වී නම් එම සේවය පිළිබඳ විස්තර :————.

(i) දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ නම :————.

(ii) දරන තනතුර :————.

(iii) පත්වීමේ දිනය :————.

5. (i) උපන් දිනය හා ස්ථානය :————. (ii) වයස :————.

6. අයදුම්කරුගේ පියාගේ සම්පූර්ණ නම :————.

(7) (අ) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ පියා උපන් ස්ථානය :————.

(ඉ) අයදුම්කරුගේ පියාගේ පියාගේත් පියා උපන් ස්ථානය : ————.

8. (අ) ජාතිය :————.

(ආ) ලාංකිකයෙකු වූයේ ලියාපදිංචි කිරීමෙන් ද, පරම්පරාවෙන් ද යන වග :————.

9. දනට රැකියාවක නියුක්තව සිටී නම් එම රැකියාව පිළිබඳ විස්තර හෝ සේවා සටහන :————.

10. සුදුසුකම් :————.

උපාධිය පිළිබඳ විස්තර :————.

(අ) ගෞරව හෝ සාමාන්‍යය :————.

(ආ) පංතිය :————.

(ඉ) විශ්ව විද්‍යාලය :————.

(ඊ) වර්ෂය :————.

(උ) උපාධිය සඳහා ගත් විෂයයන් :————.

(ඌ) අන්තර් මධ්‍ය විභාගය සඳහා ගත් විෂයයන් : ————.

(එ) භාෂා මාධ්‍යය :————.

11. සිංහල/දෙමළ භාෂාවෙන් ලබාගත් උපරිම සුදුසුකම :————.

12. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හෝ පළපුරුදුකම් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.

13. තමා සේවය කිරීමට කැමැති දිස්ත්‍රික්ක පහක් කැමැත්තේ අනු පිළිවෙලට නම් කරන්න :—

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................
5. ........................................

14. චරිත සහතික පත්‍ර දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

15. කලින් යම් සේවයක යෙදී සිටියේ නම් ඒ ගැන තොරතුරු : ————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය බවට හෝ වැරදි බවට මා තෝරා ගැනීමට කලින් හෙළි වුවහොත් මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු, සොයා ගතහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කර දැමිය හැකි බවත් මම දනිමි.

........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :........................................

3–1254—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/2/184.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ඉතාලි රජයේ ශිෂ්‍යත්ව

ඉතාලි රජය විසින් 1969-70 අධ්‍යයන වර්ෂය සඳහා පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. ශිෂ්‍යත්ව පහත සඳහන් වර්ගයන්ට අයිති වන්නේ ය :—

(අ) විශ්ව විද්‍යාලයන්හි හා වෙනත් උසස් අධ්‍යයන ආයතනයන්හි විශේෂඥ හා පශ්චාත් උපාධි අධ්‍යයන.

(ආ) ඉතාලියේ අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානයන්හි පාඨමාලා.

(ඉ) විශ්ව විද්‍යාලයක හෝ උසස් අධ්‍යයන ආයතනයක එක් විශේෂ විෂයක පාඨමාලා.

(ඊ) පෙරූජියා හි "ඉතාලියානා පර් ස්ට්‍රැනියරි විශ්ව විද්‍යාලයය"යි පවත්වන ඉතාලි භාෂාව පිළිබඳ පාඨමාලා හෝ ඉතාලි විශ්ව විද්‍යාල හෝ ආයතන විසින් සංවිධානය කරනු ලබන විදේශීන් සඳහා ඉතාලි භාෂාව හා සංස්කෘතිය පිළිබඳ පාඨමාලා.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍ය 1 :** රජයේ සේවකයන්ගේ අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය 3 :** එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය :** ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මාස 12 ක් වන්නේ ය. එහෙත් (අ) හා (ආ) වර්ගයන්ට අයත් ශිෂ්‍යත්ව, අවශ්‍ය වුවහොත්, ඊළඟ අධ්‍යයන වර්ෂය සඳහා දීර්ඝ කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය. අනෙක් වර්ගයන් යටතේ ගැනෙන ශිෂ්‍යත්ව දීර්ඝ කරනු නොලැබේ. එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ඉතාලි බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම් :** අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1969.12.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි.

(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

(iv) (අ) ඉල්ලුම් කරන්නේ (අ), (ආ) හා (ඉ) වර්ගයන්ට අයත් ශිෂ්‍යත්ව සඳහා නම් ඉහත 3(i), (ii) හා (iii) ඡේදයන්හි සඳහන් සුදුසුකම් වලට අමතරව යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන විෂයයට අදාල වනසේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුය.

(ආ) ඉල්ලුම් කරන්නේ (ඊ) වර්ගයේ ශිෂ්‍යත්වයක් සඳහා නම් ඉහත 3 (i), (ii) හා (iii) ඡේදයන්හි සඳහන් සුදුසුකම් වලට අමතරව, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හා යටත් පිරිසෙයින් ඉතාලි භාෂාව පිළිබඳ මූලික දැනීමක් තිබිය යුතුය. (අපේක්ෂකයින් සිය දැනීමේ ප්‍රමාණය සඳහන් කළ යුතුයි.)

**සංලක්ෂ්‍යය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1969.12.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම්, මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ඉතාලි යෑම හා ආපසු පැමිණීම සඳහා ගමන් වියදම්;

(ආ) මසකට ලීරේ 90,000 බැගින් දීමනාවක් (ලංකාවේ රුපියල් 855.00 ක් පමණ වේ.)

(ඉ) රක්ෂණය.

(ඊ) වෙනත් අනුමත කළ වියදම්.

**සංලක්ෂය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවක යන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය :** සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ශිවිසුම :** තෝරාගනු ලබන අපෙක්ෂකයන් ඉතාලිය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය :** තෝරාගනු ලබන අපෙක්ෂකයන් ඉතාලියේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම්පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපෙක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාමයෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවින්නක් හෙයිනි.

12. යම් අපෙක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත් වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම්පත්, 1969.4.10 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතුවන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු සි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන් අයදුම්පත් තමන්ගේ ප්‍රදේශය භාර අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් එවිය යුතුය.

17. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මාර්තු මස 21 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

3–1256—69.3.28 දින අංක 14,847 දරණ ගැසට් පත්‍රය

---

අංකය : විආ/5/172

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ජාතික විද්‍යා පදනමේ ශිෂ්‍යත්ව 1969

ජාතික විද්‍යා පදනම විසින් පළපුරුදු විද්‍යා ගුරුවරුන් පුහුණු කරවීම සඳහා පදනමේ අධ්‍යයන වාර්ෂික වැඩ සටහන යටතේ පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ශිෂ්‍යත්ව අදහස් කොට ඇත්තේ දැනට මධ්‍ය මහා විද්‍යාලවල හා මහා විද්‍යාල වල අ. පො. ස. (සාමාන්‍ය පෙළ) පන්ති වල විද්‍යාව (එනම් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක්) ඉගැන්වීමේ යෙදී සිටින්නාවූ ද, පුහුණුවෙන් පසු ආපසු පැමිණ පාඨශාලාවල විද්‍යාව ඉගැන්වීම, සේවයේ යෙදී සිටින්නන් පුහුණු කරවීමේ වැඩ සටහන් හා පාඨමාර්ග සංස්කරණ වැඩ සටහන් සම්බන්ධයෙන් සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කළ හැකි වූද බුද්ධිමත් හා පළපුරුදු විද්‍යා ගුරුවරුන් සඳහා ය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් එක් අධ්‍යයන වර්ෂයකි. එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ එක්සත් ජනපද බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම් :**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු සි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1969.4.1 වැනි දිනට, වයස අවුරුදු 45 ට අඩු විය යුතුයි.

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක දෙවැනි පෙළ විද්‍යා උපාධිධරයකු විය යුතුයි.

(iv) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) පන්ති වල විද්‍යාව ඉගැන්වීමේ අවුරුදු පහක පළපුරුද්දක් තිබිය යුතුයි.

(v) අලුත් නිර්දේශ පත්‍ර හා අලුත් පාඨමාලා අනුව විද්‍යාව ඉගැන්වීමේ පළපුරුද්දක් ද තිබිය යුතුයි.

(vi) ඉංග්‍රීසි පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුයි.

(vii) මීට කලින් ඇමෙරිකා එක්සත් ජනපදයේ පුහුණුවක් හෝ අධ්‍යාපනයක් ලැබූවකු නොවිය යුතුයි.

**සංලක්ෂය 1.**— සේවයේ නියුක්ත වූවන් පුහුණු කරවීමේ වැඩ සටහන් අධ්‍යයන සාකච්ඡා, පාඨමාර්ග සංස්කරණ වැඩ සටහන්, පාඨමාලා පිළියෙළ කිරීම පිළිබඳ ක්ෂේත්‍ර අත්හදා බැලීම් හා වෙනත් අන්දමේ ක්‍රියාකාරී පර්යේෂණාත්මක වැඩ සටහන් වලට සහභාගිවූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සංලක්ෂය** 2.—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1969.4.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂය** 3.—එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ ගුරුවරුන් ද මේ සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) එක්සත් ජනපදයට යාම හා ආපසු පැමිණීම සඳහා ගමන් පහසුකම්,

(ආ) සෑහෙන යැපීම් දීමනාවක්,

(ඉ) පුහුණු කාලය තුළ අවශ්‍ය වෙනත් වියදම් ආපසු ගෙවීම.

**සංලක්ෂය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය. අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනයේ සිට දින කීපයක් ඇතුළත කෙටි දැන්වීමකින් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙනු ඇත.

6. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ඇමෙරිකා එක්සත් ජනපදයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

7. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

8. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

9. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාමයෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රධානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

10. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයන් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

11. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

12. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

13. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම්පත්, 1969.4.10 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් එවිය යුතු නොවේ.

14. සෑම අයදුම්පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

15. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මාර්තු මස 21 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

3–1260—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## පිළිගැනීමේ නිලධාරි තනතුරු

කටුනායක, ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි, ලංකා සංචාරක මණ්ඩලයේ, සංචාරක ප්‍රවෘත්ති මධ්‍යස්ථානයෙහි පිළිගැනීමේ නිලධාරීන් සඳහා ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයා ලංකාවේ ඕනෑම තැනක සේවය කිරීමට සූදානම් විය යුතුය.

**අවම අධ්‍යාපන සුදුසුකම්.**—සියළුම අයදුම්කරුවන් —

(අ) ඔහු/ඇය 69.4.1 දිනට අවුරුදු 21 ට නොඅඩුයයිද, අවුරුදු 30 ට නොවැඩියැයි ද,

(ආ) වාර 2 කට නොවැඩි ගණනකදී අ. පො. ස. (සාමාන්‍ය) පරීක්ෂණයේ විෂයයන් 6 (හයකින්) සමත්වී ඇතැයි ද, මින් ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් 3 කින් සම්මාන ලැබී ඇතැයි ද,

සතුටුදායක සාක්ෂි සැපයිය යුතුය.

**අමතර සුදුසුකම්.**—මතු දැක්වෙන සුදුසුකම් අමතර සුදුසුකම් ලෙස සලකනු ලැබේ :—

(අ) මතු දැක්වෙන විදේශීය භාෂාවන්ගෙන් එකක හෝ වැඩි ගණනක ක්‍රියාකාරී දැනුම :—

(i) ප්‍රංශ
(ii) ජර්මන්
(iii) ස්පාඤ්ඤ සහ
(iv) ඉතාලි

(ආ) ලංකාවේ ඉතිහාසය, භූගෝලය, සංස්කෘතික සහ ආර්ථිකය පිළිබඳ මනා දැනුම.

තෝරාගනු ලබන අපේක්ෂකයා, දහවල් හෝ රාත්‍රියෙහි සේවය කිරීමට සූදානම් විය යුතුය. රාත්‍රි නවාතැන් පහසුකම් සපයනු නොලැබේ. රාජකාරියෙහි යෙදී සිටින වේලාවන්හි, ඔවුහු මණ්ඩලය විසින් සපයන නිල ඇඳුමක් ඇඳිය යුතුවේ. තෝරාගනු ලබන අපේක්ෂකයා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල අසල පදිංචි විය යුතුය.

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළුව, මසකට රු. 230—10—රු. 480.

සුදුසුකම් වයස සහ පළපුරුද්ද අනුව, තෝරාගනු ලබන අපේක්ෂකයා, මෙම වැටුප් ක්‍රමයේ සුදුසු අංශයක තැබිය හැක.

**සේවා කොන්දේසි.**—තෝරාගනු ලබන අපේක්ෂකයා, දැනටමත් රජයේ සේවකයකු නොවේ නම්—

(අ) අවුරුදු දෙකක පරිවාස කාලයකට යටත්විය යුතුය.

(ආ) ඔහු/ඇයගේ ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ඇ) දැනට සකස්කර ඇති හෝ මතුවට සකස් කෙරෙන මණ්ඩලීය නීති රීති වලට අනුකූලත්වයක් දැක්විය යුතුය.

(ඈ) නියමිත කාල සීමාවක් තුළදී, මණ්ඩලය විසින් නියමිත මට්ටමක සිංහල ප්‍රවීනතාවයක් ලබාගත යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට හෝ මණ්ඩලීය අර්ථසාධක අරමුදලක් ඇති වූ හෝ ඇති කළ විටෙක, එයට දායකයකු විය යුතුය.

(ඊ) මණ්ඩලය විසින් නියම කරනු ලැබුවහොත් ඇප තැබිය යුතුය.

රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවල නිලධාරීන්ගේ ඉල්ලුම් පත්, රජයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ සංස්ථා ප්‍රධානියා මගින්, මෙම නිලධාරියා මුදාහැරිය හැකිද, යන්න දක්වමින් ඉදිරිපත් කළ යුතුය.

අයැදුම්පත් සමග, සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් නොකළ යුතුය.

**මෙය උදෙසා කුමන ක්‍රමයේ හෝ අයුතු බලපෑම්, ඉල්ලුම්පත අයෝග්‍ය වීමට හේතුවනු ඇත.**

සියලුම ඉල්ලුම්පත් 69.4.15 දින හෝ ඊට පෙර, කොළඹ, තැ. පෙ. 1504, ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන්නට සැලැස් විය යුතුය.

මෙහි නියමිත, අඩුම සුදුසුකම්වත් නොමැති අයගේ ඉල්ලුම් පත්, භාරගනු නොලැබේ.

අයැදුම් පත බහා එවන කවරයෙහි වම් පස ඉහල කෙලවරේ " පිළිගැනීමේ නිලධාරි තනතුර" යන වචන සඳහන් කළ යුතුය.

සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය,
කොළඹ.

1969.3.21.

3–1258—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### රජයේ විද්‍යාලයයන්හි I වැනි ශ්‍රෙණියේ මුල්ගුරු තනතුරු,

### II වැනි ශ්‍රෙණියේ මුල්ගුරු/ජ්‍යොෂ්ඨ උපගුරු තනතුරු

පහත සඳහන් අධ්‍යාපනික ප්‍රදේශවලට අයත් පුරප්පාඩු ඇති අධ්‍යාපනික දිස්ත්‍රික්කවල සිංහල, දෙමළ හා මුස්ලිම් විද්‍යාලයයන්හි I වැනි ශ්‍රෙණියේ මුල්ගුරු තනතුරු හා II වැනි ශ්‍රෙණියේ මුල්ගුරු/ජ්‍යොෂ්ඨ උපගුරු තනතුරු සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම නිවේදනය සමග පළ කර ඇති ආදර්ශ අයදුම් පත අනුව පිළියෙළ වූ අයදුම් පත්, " කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්, (පාඨශාලා පරිපාලන ශාඛාව)" යන ලිපිනයට 1969 අප්‍රියෙල් මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් එවිය යුතු ය. අයදුම් පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, " I වැනි ශ්‍රෙණියේ මුල්ගුරු තනතුර—*සිංහල/*දෙමළ/*මුස්ලිම් " හෝ " II වැනි ශ්‍රෙණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු තනතුර—*සිංහල/*දෙමළ/*මුස්ලිම් " හෝ යනුවෙන් ඉල්ලුම් කරන තනතුරේ නම පැහැදිළිව සඳහන් කළ යුතු වේ. (*අනුචිත වචන කපා හරින්න).

| අධ්‍යාපනික ප්‍රදේශය | පුරප්පාඩු ඇති අධ්‍යාපන දිස්ත්‍රික්ක |
|---|---|
| 1. බණ්ඩාරවෙල | බණ්ඩාරවෙල<br>මොණරාගල |
| 2. අනුරාධපුරය | අනුරාධපුරය<br>පොලොන්නරුව |
| 3. මඩකලපුව | මඩකලපුව<br>ත්‍රිකුණාමලය<br>අම්පාර<br>කල්මුණේ |
| 4. යාපනය | වවුනියාව<br>මන්නාරම |
| 5. නුවරඑළිය | ... නුවරඑළිය |
| 6. මහනුවර | මහනුවර<br>මාතලේ |
| 7. හලාවත | හලාවත<br>පුත්තලම |
| 8. කුරුණෑගල | ... කුරුණෑගල |
| 9. කෑගල්ල | ... කෑගල්ල |
| 10. රත්නපුරය | ... රත්නපුරය |
| 11. මාතර | මාතර<br>තංගල්ල |

**සටහන.**—අයදුම්කරුවෙකුට ඉහත සඳහන් අධ්‍යාපනික ප්‍රදේශවලට අයත් පුරප්පාඩු ඇති අධ්‍යාපනික දිස්ත්‍රික්ක අතුරෙන් තමන් කැමැති ඕනෑම අධ්‍යාපනික දිස්ත්‍රික්ක තුනක් (3) නම් කළ හැක. එහෙත් එසේ නම් කරන ලද අධ්‍යාපනික දිස්ත්‍රික්කවල සෑහෙන තරම් පුරප්පාඩු නොමැති වුවහොත්, තෝරා ගනු ලැබූ අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අධ්‍යාපනික දිස්ත්‍රික්ක අතුරෙන් වෙනත් ඕනෑම අධ්‍යාපනික දිස්ත්‍රික්කයකට පත් කර යැවීමේ බලය දෙපාර්තමේන්තු ප්‍රධානියා සතු වේ.

2. **වයස් සීමාව.**—අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නො අඩු විය යුතු ය.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මේ තනතුරු ස්ථිර ය ; විශ්‍රාම වැටුප් සහිත ය. පත් කරනු ලැබුවකු තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් වාර්තා යටතේ විශ්‍රාම වැටුප් හිමි ගුරුවරයකු/ගුරුවරියක වශයෙන් තනතුරක් දැරුවේ නම් ඔහු/ඇය විසින් මෙම තනතුර දරණ තෙක් විශ්‍රාම වැටුප් වාර්තා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවෝ අවුරුද්දක වැඩ බැලීමේ කාල පරිච්ඡෙදයකට යටත්ව අළුත් තනතුරට පත් කරනු ලබති. තනතුර ස්ථිර කිරීමෙන් පසු මුදල් රෙගුලාසි අනුව, ශ්‍රෙණියට උසස් කරනු ලැබූ දින සිට නියමිත වැටුප් ක්‍රමයේ ඔවුහු පිහිටුවනු ලබති.

(iii) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිසත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම පිණිසත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් විසින් ක්‍රියා කළ යුතු වේ.

(iv) තෝරා ගනු ලැබූ අයදුම්කරුවකුට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සිදු වනු ඇත.

4. **වැටුප් හා දීමනා.**—(අ) මෙම තනතුරු සඳහා වූ වැටුප් ක්‍රම මෙසේ ය;

(i) I වැනි ශ්‍රෙණියේ මුල්ගුරු තනතුරු :

පුහුණු I පෙළ සහතිකය : වර්ෂයකට රු. 1,776—$7 \times 72$ හා $9 \times 120$— රු. 3,360 කි.

නුපුහුණු I පෙළ ගුරු සහතිකය : වර්ෂයකට රු. 1,728—$11 \times 72$— රු. 2,520 කි.

(ii) II වැනි ශ්‍රෙණියේ මුල්ගුරු/ජ්‍යොෂ්ඨ උපගුරු තනතුරු :

පුහුණු I පෙළ සහතිකය : වර්ෂයකට රු. 1,524—$8 \times 72$ හා $9 \times 120$—රු. 3,180 කි.

නුපුහුණු I පෙළ සහතිකය : වර්ෂයකට රු. 1,488—$11 \times 72$— රු. 2,280 කි.

(ආ) ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවල් කුලී, ජීවන වියදම් දීමනාව හා විශේෂ ජීවන දීමනාව ද ගෙවනු ලැබේ

5. අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.—(අ) I වැනි ශ්‍රෙණියේ මුල්ගුරු තනතුරු සඳහා :

(i) මුල්ගුරු II වැනි ශ්‍රෙණියේ යටත් පිරිසෙයින් අවුරුදු එකක සේවයත්, පුහුණු I වැනි පෙළ සහතිකයත් දැරිය යුතු ය ; **නැතහොත්**

(ii) මුල්ගුරු II වැනි ශ්‍රෙණියේ යටත්පිරිසෙයින් අවුරුදු එකක සේවයත්, නුපුහුණු I වැනි පෙළ ගුරු සහතිකයත් දැරිය යුතු ය ; **නැතහොත්**

(iii) පුහුණු I වැනි පෙළ සහතිකය ලැබීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු හතරක සේවයක් දැරිය යුතුය ; **නැතහොත්**

(iv) නුපුහුණු I වැනි පෙළ ගුරු සහතිකය ලැබීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු පහක සේවයක් දැරිය යුතු ය.

(ආ) **II වැනි ශ්‍රෙණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු තනතුරු සඳහා:**

(i) පුහුණු I වැනි පෙළ සහතිකය ලැබීමෙන් පසු යටත්පිරිසෙයින් අවුරුදු දෙකක සේවයක් දැරිය යුතු ය ; **නැතහොත්**

(ii) නුපුහුණු I වැනි පෙළ සහතිකය ලැබීමෙන් පසු යටත්පිරිසෙයින් අවුරුදු තුනක සේවයක් දැරිය යුතු ය.

(ඉ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතු ය.

සටහන.—(i) මෙහි සඳහන් කර ඇත්තේ අයදුම්කරුවන්ට අඩුම වශයෙන් තිබිය යුතු සුදුසුකම් ය. ඉගැන්වීම සම්බන්ධයෙන් අදළ අමතර සුදුසුකම් දරණ අය කෙරෙහි හා බාහිර වැඩ කටයුතු ගැන උනන්දුවක් දක්වා ඇති අය කෙරෙහි ද වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ii) ගුරු/මුල්ගුරු වශයෙන් සේවා කාල ගණන් ගැනීමේ දී අධ්‍යයන නිවාඩු හා වැටුප් රහිත නිවාඩු කාල ගණන් ගනු නො ලැබේ.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවකුම සූදානම් විය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික හෝ භාර ගනු නො ලැබේ).

(ආ) උසස් අධ්‍යාපනික සහතිකය.

(ඉ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතු ය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

7. ඉල්ලුම් පත් හා ඒ හා සම්බන්ධ අනිකුත් ලියකියවිලි සියල්ලක්ම "කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් (පාඨශාලා පරිපාලන ශාඛාව)" වෙත මිස මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතු ය.

8. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කිරීමට කැමැති අයදුම්කරුවන් විසින් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම් පත බැගින් එවිය යුතු ය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන්, රාජ්‍ය සේවා තනතුරු වලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරවනු ලැබේ.

10. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත් භාර ගනු නො ලැබේ.

ඩී. ජී. දයාරත්න,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1969 මාර්තු මස 21 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.
පාප/8/216

## ආදර්ශ අයදුම් පත

**රජයේ සිංහල*/දෙමළ*/මුස්ලිම්* විද්‍යාලයයන්හි *I වැනි ශ්‍රේණියේ මුල්ගුරු/* II වැනි ශ්‍රේණියේ මුල්ගුරු—ජ්‍යෙෂ්ඨ උපගුරු තනතුර සඳහා අයදුම් පත**

* (අනවශ්‍ය කොටස් කපා හරින්න)

1. (i) මුල් අකුරු සහිත නම :————.
   (ii) සම්පූර්ණ නම :————.
2. ගුරුවරයකු වශයෙන් ලියාපදිංචි කිරීමේ අංකය :————.
3. දැනට සේවය කරන පාසල හා එහි ලිපිනය :————.
4. දැනට දරණ තනතුර හා ශ්‍රේණිය :————.
5. දැනට ලබන වැටුප් ක්‍රමය හා මාසික මූලික වැටුප :————.
6. (අ) ජාතිය :————. (ආ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
7. ආගම :————.
8. (i) උපන් දිනය :————. අවුරුද්ද :————.මාසය :————.
   දිනය :————.
   (ii) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————.
   මාසය :————.
9. ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදයේ දක්වෙන සුදුසුකම් අතුරෙන්, ඉල්ලුම් කරන තනතුර සඳහා සුදුසුකම් ලබා ඇත්තේ කුමන අනුච්ඡේදය යටතේද යන වග :————.
10. ගැසට් නිවේදනයේ I වැනි ඡේදයේ දක්වෙන අධ්‍යාපනික දිස්ත්‍රික්ක අතුරෙන් අයදුම් කරන අධ්‍යාපනික දිස්ත්‍රික්ක තුන (3) අනු පිළිවෙලින් :
    1———— 2. ————. 3. ————.
11. ගැසට් නිවේදනයේ සඳහන් අනික් තනතුර සඳහාත් අයදුම් පතක් එවා ඇත්නම් ඒ කුමන තනතුර සඳහා ද යන වග :————.
12. දරණ වෘත්තීය සහතිකය පිළිබඳ විස්තර :————.
    (i) පුහුණු සහතිකයක් ද නුපුහුණු සහතිකයක් ද යන වග :————.
    (ii) සහතික පත්‍රයේ අංකය හා වලංගු දිනය :————.
    (iii) සහතික පත්‍රය I වැනි පෙළට උසස් කරනු ලැබ ඇත්තේ කවද සිටද යන වග :————.
13. II වැනි ශ්‍රේණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත්තේ කවද සිට ද යන වග :————.
14. අධ්‍යයන නිවාඩු කාල සීමා හා වැටුප් රහිත නිවාඩු කාලයන් අත් හැර, අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට—
    (i) පුහුණු I පෙළ සහතිකය ලැබීමෙන් පසු සේවා කාලය : අවුරුදු : ————.මාස :————.
    (ii) නුපුහුණු I පෙළ ගුරු සහතිකය ලැබීමෙන් පසු සේවා කාලය : අවු. :————. මාස :————.
    (iii) II වැනි ශ්‍රේණියේ මුල්ගුරු/ජ්‍යෙෂ්ඨ උපගුරු වශයෙන් සේවා කාලය : අවු. :————. මාස :————.
15. ලබා ඇති උසස් අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර :————.
16. ලබාගෙන ඇති අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර : —

| අධ්‍යයන නිවාඩු කාල සීමාව | අධ්‍යයන පාඨමාලාවේ නම | අධ්‍යයන ස්ථානය |
|---|---|---|
| ............................ | ............................ | .............. |
| ............................ | ............................ | .............. |

17. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනෙන් අවසන් වූ අවුරුදු පහ (5) ඇතුලත වැටුප් රහිත නිවාඩු ලබා ඇති දින ගණන :————.
18. ගුරුවරයකු/ගුරුවරියක වශයෙන් මුළු සේවා සටහන :—

| විදුහලේ නම | දරූ තනතුර | සිට | දක්වා | අවුරුදු | මාස |
|---|---|---|---|---|---|
| .............. | ............................ | | | ............................ | |
| .............. | ............................ | | | ............................ | |

19. වෘත්තීය සහතික පත්‍රයෙහි සඳහන් සතුටුදායක සේවා සටහන් ගණන :————.
    වෘත්තීය සහතික පත්‍රයෙහි සඳහන් අසතුටුදායක සේවා සටහන් ගණන :————.
    අසතුටුදායක සේවා සටහන් ලබා ඇති කාල සීමා :————.
20. භාර්යාව/පුරුෂයා රජයේ ගුරුවරයෙකු/ගුරුවරියක නම් :—
    (i) ඔහුගේ/ඇගේ නම :————.
    (ii) දරණ තනතුර හා ශ්‍රේණිය :————.
    (iii) දරණ සහතිකය :————.
    (vi) දැනට සේවය කරන පාසල හා ලිපිනය :————.
21. විශේෂ සුදුසුකම් වෙතොත් ඒවා :————.

මෙම අයදුම් පතෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි හෝ බව මා තෝරා ගැනීමට පෙර එළිදරව් වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත් පත් කිරීමෙන් පසු ඒ බව එළිදරව් වුවහොත් මට කිසිදු වන්දියක් නො ගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————.
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

3–1258—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : විආ/2/169.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1968 ඕස්ට්‍රේලියානු තැපැල් මාර්ගික ශිෂ්‍යත්ව

### විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම

1968.11.22 වැනි දින අංක 14,829 දරණ ගැසට් පත්‍රයේ ඉහත සඳහන් මැයින් පළ කරන ලද නිවේදනයේ 2 වැනි ඡේදය පහත සඳහන් අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලාංකිකයන් විය යුතුය.

(ii) 1968.12.6 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(iii) පාඨශාලාවක ඉංග්‍රීසි ඉගැන්වීමේ යෙදී සිටින 1 වැනි පෙළ හෝ 2 වැනි පෙළ හෝ ඉංග්‍රීසි ගුරු සහතික පත්‍රය දරණ, ඉංග්‍රීසි ගුරුවරුන් විය යුතුයි.

(iv) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයක් වත් ලබා සිටිය යුතුයි.

3. 1968.11.22 දින ගැසට් නිවේදනය පරිදි දැනටමත් මෙම ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවීම අනවශ්‍ය ය. අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 1969.4.11 දක්වා දීර්ඝ කරන ලදී.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මාර්තු මස 21 වැනි දින,
කොළඹ 2,
මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

3–125—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

සටහන 4.—ගුරු/මුල්ගුරු/විදුහල්පති/විශේෂ තනතුරුධාරී වශයෙන් සේවා කාල ගණන් ගැනීමේ දී අධ්‍යයන නිවාඩු හා වැටුප් රහිත නිවාඩු කාල ගණන් ගනු නො ලැබේ.

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සැම අපේක්ෂකයෙකුම සූදනම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය, (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාර ගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස් අධ්‍යාපනික සහතිකය ;

(සී) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඩී) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික ;

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

7. අයදුම්පත් හා ඒ හා සම්බන්ධ අනිකුත් ලියකියවිලි සියල්ලක්ම කොළඹ 2, මැලේ විදියේ, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ''ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්'' (පාසල් පරිපාලන ශාඛාව) යන ලිපිනයට මිස මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන්, රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. තනතුරු එකකට වැඩි ගණනක් සඳහා අයදුම් කිරීමට කැමති අයදුම්කරුවන් විසින් **එක් එක් තනතුරු සඳහා වෙන වෙන ම අයදුම් පත්‍රය බැගින් එවිය යුතුය.**

10. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

ඩී. ජී. දයාරත්න,
ස්ථාවර ලේකම් හා අධ්‍යාපන
අධ්‍යක්ෂ ජනරාල්.

1969 මාර්තු මස 21 වැනි දින,
කොළඹ 2, මලයි විදියේ,
අධ්‍යාපන හා සාංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### සිංහල/දෙමළ මාධ්‍යයෙන් උගැන්වීම කැරෙන රජයේ මහා විද්‍යාලයන්හි II/III වැනි ශ්‍රෙණියේ විදුහල්පති තනතුර සඳහා අයදුම් පත්‍රයයි

(අනවශ්‍ය කොටස් කපා හරින්න.)

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ස්ත්‍රී පුරුෂ භාවය :————.
4. විවාහක අවිවාහක බව :————.
5. දැනට සේවය කරන පාසැලේ නම හා ලිපිනය :————.
6. ගුරුවරයකු/වරියක වශයෙන් ලියා පදිංචි කිරීමේ අංකය :————.
7. උපන් දිනය :————.
8. පරම්පරාවෙන් ලාංකික ද, එසේ නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ලාංකික ද යන බව :————.
9. ආගම :————.
10. අධ්‍යාපනික සුදුසුකම් :—
    (අ) උපාධිය :————.
    (ආ) විශ්ව විද්‍යාලය :————.
    (ඉ) අවුරුද්ද :————.
    (ඊ) උපාධියේ පෙළ/පන්තිය :————.
    (උ) උපාධියට ගත් විෂයයන් :————.
11. වෘත්තීය සුදුසුකම් :—
    (අ) පුහුණු ගුරුවයකු/වරියක නම් :—
        (i) පුහුණුව ලැබූ ගුරු විද්‍යාලයය :————.
        (ii) පුහුණුව ලැබූ කාල සීමාව :————.
        (iii) සහතිකයේ අංකය හා වලංගු දිනය :————.
        (iv) සහතිකය 1 වැනි පෙළට උසස් වූ දිනය :————.
    (ආ) නුපුහුණු ගුරු සහතික පත්‍ර ලත් ගුරුවරයකු/වරියක නම් :—
        (i) සහතිකයේ අංකය සහ වලංගු දිනය :————.
        (ii) සහතිකය 2 වැනි පෙළට උසස් වූ දිනය :————.
        (iii) සහතිකය 1 වැනි පෙළට උසස් වූ දිනය :————.
    (ඉ) මුල්ගුරු වරයකු/වරියක නම්, ශ්‍රෙණිය හා එම ශ්‍රෙණියට පත් වූ දිනය :————.
    (ඊ) විශේෂ තනතුරු ධාරියකු/ධාරිනියක නම්, ශ්‍රෙණිය හා එම ශ්‍රෙණියට පත්වූ දිනය :————.
    (උ) විදුහල්පති වරයකු/වරියක නම්, ශ්‍රෙණිය හා එම ශ්‍රෙණියට පත් වූ දිනය :————.
12. වෙනත් සුදුසුකම් වෙතොත් ඒවා :————.
13. වෘත්තීය සහතිකයේ පසුගිය පස් අවුරුද්ද ඇතුළත ලබා ඇති සටහන පහත උපුටා දක්වන්න :—
14. සිංහල/දෙමළ දැනුම පිළිබඳ තොරතුරු :————
15. සේවා සටහන :—

| පාසැලේ නම | සිට | දක්වා | දූරු කතතුරු |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |

16. (i) අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර හා කාල සීමාවන් පහත සඳහන් කරන්න.
    (ii) පසුගිය අවුරුදු 12 ඇතුළත පඩි රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් එම කාල සීමා පහත සඳහන් කරන්න.
17. (i) අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් ප්‍රශංසා ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.
    (ii) රජය යටතේ සේවා කාලය තුළදී විනයානුකූලව දඬුවම් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.
18. වෙනත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.
19. ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදයේ දැක්වෙන සුදුසුකම් අතුරෙන් තමා ඉල්ලුම්කරන තනතුර සඳහා සුදුසුකම් ලබා ඇත්තේ කුමන අනුඡේදය යටතේ ද යන වග :————.
20. ගැසට් නිවේදනයේ I වැනි ඡේදයේ දැක්වෙන අධ්‍යාපනික දිස්ත්‍රික්ක අතුරෙන් තමන් අයදුම්කරන අධ්‍යාපනික දිස්ත්‍රික්ක තුන (3) අනු පිළිවෙළින් :—
    1. ————.
    2. ————.
    3. ————.
21. මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි හෝ බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නො ගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3-1257—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### විකලාංග වැඩපලේ පෝර්මන් තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, කොළඹ විකලාංග වැඩපලේ පෝමන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි මතු දැක්වෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 1969 අප්‍රියෙල් 15 දින හෝ ඊට පෙර හෝ එවිය යුතු ය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 1,860—120—3,780 කි. රු. 2,820 ක් වූ වාර්ෂික වැටුප් පියවර ලැබීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වෙයි.

3. **සේවයෙහි නියුක්ත කරවීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකරනු ලැබේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සැම අයදුම්කරුවකු විසින්ම,
(i) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන්, හෝ
(ආ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය ඇතුලු විෂයයන් හයක් සහිතව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය) විභාගය

සහ

(ii) (අ) පිළිගත් කාර්මික ආයතනයක විදුලි හෝ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් ගේ සහතිකය

හෝ

(ආ) (i) පිළිගත් වැඩපළක පස් අවුරුදු වෘත්තීය ආධුනිකත්වය සහිත ;

(ii) පුහුණු ශ්‍රේණියක දැවුරුදු පළපුරුද්ද.

**සටහන.**—යටත් පිරිසෙයින් කණිෂ්ඨ සහතික තත්ත්වයේ නොහොත් ඒ හා සම තත්ත්වයේ අධ්‍යාපන සුදුසුකම් ලැබ ඉහත 4(2) ඡේදයේ දැක්වෙන කාර්මික සුදුසුකම් ලබා ඇත්තාවූද, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අවුරුදු 5 කට නොඅඩු අඛණ්ඩ සතුටුදායක සේවයක් ඇති නිලධාරීහුද අයදුම්පත් එවීමට සුදුස්සෝ වෙති.

5. **වයස් සීමාව.**—අයදුම්කරුවන් 1969 අප්‍රේල් 15 දිනට අවුරුදු 21 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

**සටහන.**—දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි වයස් සීමාව බලපානු නොලැබේ.

6. මතු සඳහන් ලියකියවිලි කිසිවක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට අපේක්ෂකයන් විසින් ඒවා ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය, (**සැ. යු.**—බවුතීස්ම සහතිකය හෝ උපකෘත පාසල්වල රීතිමාලාව යටතේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ මේ සඳහා පිළිගනු නොලැබේ)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය ;

(ඉ) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයේ ශික්ෂකගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය)

(ඊ) වෘත්තීය සහ/නොහොත් කාර්මික සුදුසුකම් දැක්වෙන සහතිකය

සටහන—

(i) ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිදු අයදුම්පත් සමග අමුණා නොඑවිය යුතු ය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ කල එය කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

7. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් වන අතර, ඒවා සළකා බලනු ලබන්නේ තනතුරු සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරුවලින් මුදවා හරින බවට දෙපාර්තමේන්තු ප්‍රධානීන් එකඟවුවහොත් පමණි.

8. අයදුම්පත් සහ ඊට සම්බන්ධ වෙනත් ලියකියවිලි එවිය යුත්තේ කොළඹ, තැ. පෙ. 500 හිමි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අමතා මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකු ගේ පෞද්ගලික නමට නොවේ.

9. මෙම ගැසට් පත්‍රයේ (I) වන කොටස (II) වන ඡේදය ආරම්භයේ පළ කෙරෙන රජයේ සේවයේ තනතුරුවලට කෙරෙන පත්වීම්වලට බලපාන්නාවූ පොදු කොන්දේසි බලනු මැනවි.

වී. පී. ඒ. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ 1, තැ. පෙ. 500 දරණ,
ගාලුමුවදොර, මහලේකම්පායේ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදී ය.

## අයදුම්පත් ආකෘතිය

### කොළඹ විකලාංග වැඩපොලේ ෆෝර්මන් තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(i) පෙළපත් නම :————.

(ii) අනෙක් නම් :————.

2. ලිපිනය (ලිපිනයේ වෙනසක් සිදුවුවහොත් වහාම දැනුම්දිය යුතුය) :————.

3. උපන් දිනය :————.

4. 1969 අප්‍රේල් 15 දිනට වයස—අවුරුදු :———, මාස :———, දින :——.

5. පියාගේ/භාරකරුගේ නම හා ලිපිනය :————.

6. පුරවැසි භාවය (පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ද) :————.

7. පහත සඳහන් අයගේ උපන්ස්ථාන :———.

(i) ඉල්ලුම්කරුගේ :————.

(ii) ඉල්ලුම්කරුගේ පියාගේ :————.

(iii) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(iv) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

8. ස්ත්‍රී පුරුෂ භාවය :————.

9. විවාහකද, අවිවාහකද :————.

10. අධ්‍යාපනික සුදුසුකම් :————.

11. කාර්මික සුදුසුකම් :————.

12. පාසැලෙන්/විද්‍යාලයෙන් අස්වූ දින සිට කරන ලද රැකියාව පිළිබඳ විස්තර :————.

13. විශේෂ සුදුසුකම් (දැන්වීමේ 4 වන ඡේදයෙන් ඉල්ලා ඇති විශේෂ සුදුසුකම් සහ/නොහොත් පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම් දින වකවානු සමග සම්පූර්ණ විස්තර දක්වන්න) :————.

14. ඔබ සෞඛ්‍ය දෙපාර්තමේන්තු සේවකයෙක්ද? (එසේ නම් ඒ පිළිබඳ විස්තර) :————.

මෙම අයදුම්පතේ මවිසින් සපයන්නට යෙදුණ තොරතුරු සැබෑ බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් බොරු බව හෝ වැරදි බව හෝ දැනගන්නට ලැබුණොත් තෝරා ගැනීමට පෙර නම්, එයින් මා නුසුදුස්සකු කරනු ලැබිය හැකි බවත් පත් කිරීමෙන් පසුව නම් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත් බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**3–1249—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය**

---

අංක : ඒබී 22/ඇක්ස් 2067/69

## වාණිජ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුරු

වාණිජ දෙපාර්තමේන්තුවේ සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1969 අප්‍රේල් මස 11 වැනිදා

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1969 අප්‍රේල් මස 18 වැනිදා

**සටහන් :**

(I) **මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට, අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.**

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**— ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය.

එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වේයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**— මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් වේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරුවලට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :

වර්ෂයකට රුපියල් 4,080—360×12—480×10—රු. 13,200 වණය කට රුපියල් 8,400 ට සහ රුපියල් 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත. වර්ෂයකට රුපියල් 11,280 දී දෙවර්ෂයක නැවැත්වීමක් වේ.

සටහන් :

(ඒ) වර්ෂයකට රුපියල් 8,400 ක වැටුප් පියවර ඉක්මවා යාම සඳහා ලංකා විශ්ව විද්‍යාලයේ හෝ වෙනත් පිළිගත් විශ්ව විද්‍යාලයක, වාණිජ අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ තත්ත්වයක පශ්චාත් උපාධියක් ලබාගත යුතුය.

(බී) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ එම්.එස්සී. හෝ පී.එච්ඩී. උපාධිය ලබාගත් අයදුම්කරු වකු තෝරා ගනු ලැබුවහොත් ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රුපියල් 5,160 ක ආරම්භක වැටුපක තැබීමට සුදුසු වේ.

4. **විදේශයෙහි සේවය.**—නිලධාරීන් වරින් වර විදේශයෙහි සේවය කිරීම සඳහා පත්කිරීමට ඉඩ ඇති අතර එසේ පත්කරනු ලබන අවස්ථාවලදී රජය විසින් අනුමත කෙරෙන දීමනාවන් ලැබීමට සුදුසුවනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ පළමුවැනි හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධියක් හෝ ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව සමඟ පළමුවැනි හෝ දෙවැනි පන්තියේ උපාධියක් දරණ බව, නැතහොත්

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ඇම්.ඇස්සී. හෝ පී.එච්ඩී උපාධියක් තිබිය යුතුය.

(සී) 1969. 4. 11 වැනි දිනට අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.— අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ).

(බී) උපාධි හෝ උසස් ම අධ්‍යාපන සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය ;

(ඩී) වෘත්තීය සහ/හෝ තාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ මුද්‍රිත නැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

8. අයදුම්පත් හෝ ඒ පිළිබඳ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලික නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

10. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත නැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම්පත් භාර ගන්නා දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධිවිධාන ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මාර්තු මස 20 වැනි දින,
කොළඹ 1, ගාලුමුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

3–1246—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙඩ්ඩිපලායම් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මංමුනේ දකුණ—එරාවිල් පෝරතිව් පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

වෙඩ්ඩිපලායම් උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගේ සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නො අඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපාන්නේ ය.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කායාීලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායාීල, ග්‍රාම සේවක කායාීල, පළාත් පාලන ආයතන කායාීල, ග්‍රාමීය උසාවි, තැපැල් කායාීල, පොලිස් ස්ථාන, ප්‍රජා මංඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායාීලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත්ව ඇත.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායාීලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 අප්‍රේල් මස 30 වැනි දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

බී. තේසයියා,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කායාීලය,
1969 මාර්තු මස 15.

3–1193—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපු දිස්ත්‍රික්කයේ කොක්කඩිචෝලෙයි කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මංමුනේසි දකුණ—එරාවිල් පෝරතිව් පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

කොක්කඩිචෝලෙයි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරු වන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායාීල, ග්‍රාම සේවක කායාීල,

පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුළත්ව ඇත.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 අප්‍රේල් මස 30 වැනි දිනට හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඕ. නේසයියා,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,
1969 මාර්තු මස 15.

3–1195—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කයේ අම්ර්තකාලි ග්‍රාමයේ කාර්යාලය ඇතිව මංමුනේ පත්තු උතුර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

මංමුනේ පත්තු උතුර විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපාන්නේ ය.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මංඩල ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුළත්ව ඇත.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 අප්‍රේල් මස 30 වැනි දිනට හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඕ. නේසයියා,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,
1969 මාර්තු මස 15.

3–1192—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කයේ තුරේනීලාවනෙයි කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මංමුනේ දකුණ—එරුවිල් පෝරතිව් පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

තුරේනීලාවනෙයි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපාන්නේ ය.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය, ග්‍රාම සේවක කාර්යාලය, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුළත්ව ඇත.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 අප්‍රේල් මස 30 වැනි දිනට හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඕ. නේසයියා,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,
1969 මාර්තු මස 15.

3–1194—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

උප ලේඛන සහකාර තනතුර සඳහා වයස අවුරුදු 25—45 අතර ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—ගණිතය විෂයයක් වශයෙන් ඇතිව, පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණය හෝ ඊට සමාන විභාගයක් හෝ ඊට උසස් විභාගයක්; හෝ

දැන්වීම් ප්‍රචාරක නියෝජ්‍යත්වයක අවුරුදු 5 ක පළපුරුද්ද සහිතව, අංක ගණිතය හෝ ගණිතය හා සිංහල විෂයයන්ගෙන් ලත් සාමාර්ථය සහිතව එකවර විෂයයන් හයකින් (6) සමත්ව ඇති අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගය හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයක්.

ඉංග්‍රීසිය පිළිබඳ මනා දැනුම අමතර සුදුසුකමක් ලෙස සැළකේ ; හෝ

ගුවන් හෝ විදුලි දෙපාර්තමේන්තුවේ වෙළඳෙ ස්වයේ 5 වසක පළපුරුද්ද සහිතව අංක ගණිතය හෝ ගණිතය හා සිංහල හෝ දෙමළ හා ඉංග්‍රීසි යන විෂයයන්ගෙන් ලද සාමාර්ථය ඇතිව එකවර විෂයයන් 6 කින් සමත්ව ඇති අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක් හෝ ඊට වඩා උසස් විභාගයක්.

ඉංග්‍රීසිය පිළිබඳ මනා දැනුම අමතර සුදුසුකමක් ලෙස සැළකේ.

**විශේෂ නියමය.**—ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ උප ලේඛන සහකාරයනට හා සහකාර උප ලේඛන සහකාරයනටද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

**වැටුප් ක්‍රමය.**—රුපියල් 400—625 (20 × 5—25 × 5) රු. **525** ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 අප්‍රේල් මස 12 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර " උප ලේඛන සහකාර තනතුර " යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 මාර්තු මස 13 වැනි දින,
කොළඹ 7.

### ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. අයදුම්කරු උපන් දිනය, ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
5. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :—
   සිංහළ :————.
   දෙමළ :————.
   ඉංග්‍රීසි :————.
7. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපින :————. (අධ්‍යාපන හා චරිත සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)
8. පළපුරුද්ද පිළිබඳ විස්තර හා තෝරා ගැනීමේදී ප්‍රයෝජනවත් වියහැකි වෙනත් විස්තර :————.

මා ඉහතින් ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි සත්‍ය තොරතුරු බවත්, මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පත්වුවහොත් මා විසින් ඉහතින් දෙන්නට යෙදුණ අසත්‍ය හෝ වැරදි තොරතුරක් වෙතොත් ඒ හේතුවෙන් සේවයෙන් පහකිරීමේ දඬුවම් ලැබීමට මා සුදුස්සකු වන බවත් විශේෂයෙන්ම මීට පෙර යෙදී සිටි රැකියාවල් පිළිබඳ හෝ මීට අදාළ වැදගත් කිසියම් කාරණාවක් පිළිබඳව හෝ හිතාමතා වසන් කිරීම නිසා එවැනිම දඬුවමකට මා සුදුසුවන බවත් මා වටහාගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය :————.

————
අයදුම්කරුගේ අත්සන.

3—1216—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය දව සංස්ථාව

### වැඩබිම් ඕවර්සියර් තනතුර

රාජ්‍ය දව සංස්ථාවේ වැඩබිම් ඕවර්සියර් තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් :—**

**අයදුම්කරුවන් සතුවිය යුතු සුදුසුකම් :**

1. (අ) දෙකකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/මූලික ගණිතය ඇතුළු විෂයයන් 3 කින් සම්මාන සහිතව අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 6 කින් සමත් වීම.

 උද්භිද විද්‍යාවට හෝ ජීව විද්‍යාවට සම්මාන ලත් අය කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

 (ආ) මනා ශරීර ශක්තියකින් යුක්ත වීම.

 (ඇ) 1969 අප්‍රේල් 8 දිනට වයස අවුරුදු 20 නොඅඩු සහ 25 නොවැඩි වීම.

2. **වැටුප් ක්‍රමය.**—රු. 200—5—275 හේ මාසික වැටුපකි.

3. තෝරා ගන්නා වූ අයදුම්කරුවන් විසින් 1956 යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි අවශ්‍යතාවන් පිළිපැදීම අවශ්‍ය වේ. පත්වීම 3 අවුරුදු ආධුනික කාලයකට යටත් වන අතර, තෝරා ගන්නා ලද අයදුම්කරු විසින් සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. තෝරා ගන්නා ලද අයදුම්කරුවන්ට දුෂ්කරතත්ත්වයන් යටතේ කැලෑවල කඳවුරු ගසා ජීවත්වීමට සිදුවේ.

5. රජයේ දෙපාර්තමේන්තුවල සහ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් සිය අයදුම් පත් තම දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානයන් මගින් ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්පතක්ම පහත දක්වෙන ආකෘතිය අනුව සකස් කොට 1969 අප්‍රේල් 8 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

6. මෙහිලා දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන්නාවූ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. අයදුම් පත් ලැබුණු බව දන්වා නොඑවනු ලබන අතර, තනතුර ගැන හෝ අයදුම් පත් ගැන හෝ කිසිදු ලිපි ගනුදෙනුවක් නොකරනු ඇත.

සේවක කළමනාකාර,
රාජ්‍ය දව සංස්ථාව.

30, අශෝක උයන,
කොළඹ 4,
1969 මාර්තු 16 දින.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**වැඩබිම් ඕවර්සියර් තනතුර—රාජ්‍ය දැව සංස්ථාව**

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. වයස සහ උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
4. ජාතිය :————.
5. අධ්‍යාපනික සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) : ————.
6. පළපුරුද්ද :————.
7. වෙනත් සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) : ————.
8. නිර්දේශකයින් (මෑතදී ලබා ගන්නා ලද සහතික පිටපත් 3 ක් ඇමිණිය යුතුය) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සැ : යු : සහතිකවල මුල් පිටපත් අයදුම්පත්වලට අමුණා එවිය යුතු නොවේ.

3–1239—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## නිවැරදි කිරීමයි

### රාජකීය ලංකා නාවික හමුදාව

### සහකාර වැඩ මූලික (නැව් කාර්මික ශිල්පි)

1969 පෙබරවාරි 28 වෙනි දින අංක 14,843 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II වැනි ඡෙදයේ) 305 වැනි පිටුවේ පල වී ඇති දැන්වීමේ 7 වැනි ඡේදයේ "(ආ) අධ්‍යාපනික සුදුසුකම්" යන කොටසට යටින් පහත සඳහන් කොටස ඇතුළත් විය යුතුයි :—

"(ඇ) **ආධුනික කාලය හා පළපුරුද්ද**—ආධුනික කාලයක් අවශ්‍ය නැත. එහෙත් ඊට සරිලනසේ පළපුරුදු කාලය අවශ්‍ය ආධුනික කාලයට සමාන ප්‍රමාණයකින් දීර්ඝ විය යුතුය. එනම් අවුරුදු (8) අටක්ය."

"(ආ) අධ්‍යාපනික සුදුසුකම්" යන කොටසට යටින් නැවතත් වැරදි ලෙස මුද්‍රණය වී ඇති "(ආ) අධ්‍යාපනික සුදුසුකම්" යන කොටස ඉවත් කලසේ සැලකිය යුතුය.

3–917—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### යාන්ත්‍රික ෆෝර්මන් තනතුර

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 1969.4.8 වෙනි දිනට හෝ ඊට පෙර සර්වේ ජනරාල් (ආයතන අංශය) වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

2. **බඳවා ගැනීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—

(අ) මෙම තනතුර ස්ථිරය. නමුත් විශ්‍රාම වැටුප් රහිතය. නිලධාරියාගේ වැටුපෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. (තනතුර විශ්‍රාම වැටුප් සහිත වුවක් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. එවිට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වේ.)

(ආ) මෙම පත්කිරීම අවුරුදු තුනක් හා තනතුර ස්ථිර කළ බවට ලියවිල්ලක් නිකුත් කරනු ලබන තෙක් ආධුනික සේවා කාලයකට යටත් වේ.

 රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් නියමිත කාල සීමාවකට වැඩ බලන පදනමක් මත පත්කරනු ලැබේ.

 තනතුර ස්ථිර කරනු ලැබීම, රජය මගින් ඔහුට මෙරට හා පිටරට පිළියෙල කරනු ලබන ඕනෑම පාඨමාලාවක් සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීම, අදාල පරිදි ආධුනික සේවා කාලය හෝ වැඩබලන කාලසීමාව ඇතුළතදී සතුටුදායක සේවය හා හැසිරීම හා අංක 701 හා 66. 9. 4 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව නියමිත සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීම මත රඳා පවතී.

(ඇ) තෝරාගනු ලැබූ අපේක්ෂකයා පහත සඳහන් අවශ්‍යතාවයන් ගෙන් යුක්ත විය යුතුය.

 (i) දිවයිනේ ඕනෑම පලාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික යෝග්‍යතාවයෙන් යුක්ත බව, මනා ඇස් පෙනීම, සාමාන්‍ය වර්ණ දෘෂ්ටිය හා ත්‍රිමානක දර්ශනය දැන ගැනීමට පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් හා කැඳවූ විටෙකදී ඕනෑම විදේශීය රටකදී පුහුණුවීමේ පාඨමාලාවක් අනුගමනය කිරීමට ශාරීරික යෝග්‍යතාවයක් ඇතිදැයි දැන ගැනීමට පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

 (ii) වෙනත් කරුණු අතර, රජය මගින් ඔහු සඳහා මැනුම් උපකරණ සහ අදාල වෙනත් උපකරණ සකස් කිරීම, නඩත්තුව හා අළුත්වැඩියා කිරීම පිළිබඳව මෙරට හා පිටරට පිළියෙල කරනු ලබන ඕනෑම පුහුණුවීමේ පාඨමාලාවක් විශ්වාස වන්තව හා ලැදියාවෙනුත් පරිශීලනය කොට, සතුටුදායක අන්දමින් හදාරා නිම කිරීමට හා නියම කරන්නේ නම්, පුහුණුවීමේ පාඨමාලාව නිම කළ පසු යාන්ත්‍රික ෆෝර්මන් කෙනෙකු හැටියට (රජය විසින්

නීරණය කරනු ඇති) නියමිත අවුරුදු ගණනක කාල සීමාවක් රජයට සේවය කිරීමට බැඳී සිටීමට රජය සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය.

(iii) ඔහු විසින් රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරනු නොලැබේනම්, ගිවිසුමේ නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් පුහුණුවේ මුළු වියදම රජයට ආපසු ගෙවීමට එකඟවෙමින් රු. 35,000 ක් බැගින් වත්කම ඇති අනුමත කළ ඇපකරුවන් දෙදෙනෙකු සමග බැඳුම්කරයකට ඇතුලත් විය යුතුය.

වැටුප්, දීමනා, ගමන් ගාස්තු, ඉගැන්වීමේ ගාස්තු, හා රජය හා වෙනත් විදේශීය නියෝජිත ආයතනයන් විසින් දරනු ලැබූ වෙනත් වියදම්, පුහුණුවීමේ වියදමට ඇතුලත් වේ.

(iv) ඔහු විසින් රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරනු ලැබේ නම්, ගිවිසුමේ නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් පුහුණුවේ ඉහත කී පරිදි මුළු වියදම රජයට ආපසු ගෙවීමට එකඟවීමේ පුද්ගලික බැඳුම්කරයකට ඇතුලත් විය යුතුය.

(v) අයදුම්කරු යාන්ත්‍රික ෆෝර්මන් කෙනෙකු ලෙස පත්කරනු ලැබූ දිනයේ සිට ගිවිසුම හා බැඳුම්කරය ක්‍රියාත්මක වේ.

3. **වැටුප් හා දීමනා.**

මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය මෙසේය :—

වර්ෂයකට රු. 2,820—120 බැගින් වැඩිවීම් 9 සහ 180 බැගින් වැඩිවීම් 8—රු. 5340 (රු. 4080 ට පෙර කාර්යක්ෂමතා කඩඉමෙකි.)

(රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත්, මු. රෙ. 1120 අනුව වැටුප් ක්‍රමයේ වැටුප් පියවරක ඔහු පිහිටුවනු ලැබේ.)

4. **අවශ්‍ය සුදුසුකම්.**

සෑම අපේක්ෂකයෙකුම තමා පහත සඳහන් අවශ්‍යතාවයන්ගෙන් යුක්තබවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) යහපත් චරිතයකින් හා හොඳ ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බව (2 (ඇ) (1) ඡේදය බලන්න)

(ආ) '1969.4.8 වෙනි දිනට වයස අවුරුදු 20 ට අඩු නොවිය යුතු අතර, 30 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) (i) සිංහල/දෙමළ, මූලික ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථ හා ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක්ද සහිතව, දෙවරකට වැඩි නොවන වාර ගණනකදී විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථයක් සහ ;

(ii) කටුබැද්දේ ප්‍රායෝගික විද්‍යායතනයෙහි යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අවුරුදු 3 ක (අර්ධකාලීන) පාඨමාලාව හෝ, ලංකා කාර්මික විද්‍යාලයේ කර්මාන්ත ශාලා පුහුණුව පිළිබඳ අවුරුදු 2 ක පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට සහතිකයක් හෝ ඒවා හා සමාන සුදුසුකමක් සහ ;

(iii) පිළිගත් කර්මාන්තශාලා හා වැඩපොළවල් යි අවුරුදු 6 ක පලපුරුද්දක් ඇරිය යුතුය.

**සැ. යු.**—අවම අධ්‍යාපනික සුදුසුකම ලෙස කණිෂ්ඨ පාඨශාලා සහතිකය හා කර්මාන්තශාලා හා වැඩපොළවල අවුරුදු 12 ක පලපුරුද්දක් ඇති, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ උපකරණ අංශයේ ආර්ටිපයිසර් හා ප්‍රධාන ආර්ටිපයිසර්වරුන්ගෙන් අයදුම්පත් පිළිගනු ලැබේ.

පාලන ශ්‍රේණියේ පළපුරුද්දක් වේ නම් ඒ විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5. ඉල්ලා සිටි විටකදී, පහත සඳහන් ලේඛනවලින් සමහරක් හෝ සියල්ලම අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. බෞතිස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ සහතික දෙකක්. (මින් එකක් අයදුම්කරු අවසන් වරට ඉගෙනුම ලැබූ පාසැලේ ප්‍රධානාචාර්යවරයාගෙන් ලබාගත් එකක් විය යුතුය.)

(ඈ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) වෘත්තියේ පලපුරුද්ද පිළිබඳව ලබන ලද සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත්වූ උසස්ම විභාගය පිළිබඳ සහතික.

සැ. යු.—(i) පහත දැක්වෙන ආදර්ශ අයදුම්පතේ සඳහන් ලේඛනවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම් පත සමග එවිය යුතුය.

(ii) ඉල්ලා සිටි විටදී ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

(iii) (ඈ) උපඡේදය යටතේ දක්වා ඇති සහතික, දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් විසින් හෝ 4 වෙනි ඡේදය කෙලවර දැක්වෙන "සටහනෙහි" යටතේ අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

6. රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම් පතේ පිටපතක් අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර ලැබෙන සේ සර්වේ ජනරාල් (ආයතන අංශය) වෙත කෙලින්ම එවිය යුතුයි.

7. අයදුම් පත් සර්වේ ජනරාල් වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට එවිය යුතු නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටස් (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණ බව දන්වනු ඇත. 1969 4. 17 වෙනි දිනට පෙර අයදුම්පත ලැබුණු බව දන්වා ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වෙයිනම් වහාම ඒ බව සර්වේ ජනරාල් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙකු මෙම අවශ්‍යතාවය ඉටු කිරීමට අසමත් වුවහොත් තම අයදුම් පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

සී. ඊ. ගුනවර්ධන
සර්වේ ජනරාල්.

1969 මාර්තු මස 21 වැනි දින,
තැ. පෙ. 506, කොළඹ.
(ආයතන අංශය)
සර්වේ ජනරාල් කායර්‍යාලයෙහි දීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(**සැ. යු.**—සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. කිසිම කොටසක් හිස්ව තැබිය යුතු නොවේ. ඉරක් ඇඳ තිබීම පිළිතුරක් ලෙස සලකනු නොලැබේ.)

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව—යාන්ත්‍රික ෆෝර්මන් තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.
ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දැනුම් දිය යුතුය)

3. පුරවැසි භාවය හා ජාතිය :————.
(පුරවැසි භාවය පෙළපතින්ද ලියා පදිංචි කිරීමෙන්ද යන වග සඳහන් කළ යුතුය. පුරවැසි භාවය ලියා පදිංචි කිරීමෙන් නම්, ලියා පදිංචි කළ සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න.)

4. (අ) 69.4.8 වෙනි දිනට නියම වයස :————.
අවුරුදු :——, මාස :——, දින :——.
(ආ) උපන් දිනය :————.
අවුරුද්ද :——, මාසය :——, දිනය :——.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

5. උපන් ස්ථානය :————.

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ පියා :————.

(ඇ) ඔහුගේ/පියාගේ පියා :————.

(ඈ) ඔහුගේ පියාගේ පියාගේ පියා :————.

6. විවාහකද ? අවිවාහකද ? වන වග : හා දරුවන් ඇවි නම් දරුවන් ගණන :————.

7. (1) සමර්ථ වූ විභාග :————.

(අ) පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම :————.

(ආ) විභාගයේ නම :————.

(ඇ) වර්ෂය හා මාසය :————.

(ඈ) මධ්‍යස්ථානය හා විභාග අංකය :————.

(ඉ) සමර්ථ වූ විෂයයන් :————.
(සම්මාන සාමාර්ථද සාමාන්‍ය සාමාර්ථද වන වග සඳහන් කරන්න)

(ඊ) සමර්ථ වූ ඉහළම විභාගය :————.
සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

(ඔ) පාසැලෙන් අස් වූ දිනය :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

7. (ii) ලබාඇති කාර්මික වෘත්තීය සුදුසුකම්

| විභාගය | ආයතනය | වර්ෂය |
| --- | --- | --- |
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

8. පාසැලෙන් අස් වූ දින සිට, පිළිගත් කර්මාන්ත ශාලා හෝ වැඩපොළවල යෙදී සිටි රැකියාව හා පළපුරුද්ද පිළිබඳ විස්තර සඳහන් කරන්න.

(අ) ආයතනයේ නම (ආ) සේවය ආරම්භයේදී හා අවසානයේදී ලැබූ වැටුප

(ඇ) වැඩ පිළිබඳ තොරතුරු (ඇ) සේවා කාලය (වර්ෂය හා මාසය)

(ඉ) සේවයෙන් පහ කිරීමට හෝ සේවය නවතා දැමීමට හේතු දක්වන්න. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. සේවය කඩවී ඇතිනම් ඊට හේතු).

9. විශේෂ සුදුසුකම් වේ නම් ඒ පිළිබඳ විස්තර :————.

10. අයදුම්කරු අධිකරණයක දී කිසියම් අපරාධයක් පිළිබඳව චෝදනා ලැබී හෝ වරදකරුවී දඬුවම් විඳ ඇද්ද? එසේ නම්, (අ) දිනය, (ආ) නඩු අංකය, (ඇ) උසාවියෙහි නම (ඈ) චෝදනාවේ ස්වභාවය (ඉ) වරදකරුවී නම් ලැබූ දඬුවමෙහි ස්වභාවය සඳහන් කරන්න.

11. දැන් කරන රැකියාව පිළිබඳ තොරතුරු :—

(අ) ආයතනයේ හෝ දෙපාර්තමේන්තුවේ නම (ආ) රැකියාවට පත්කරනු ලැබූ දිනය (ඇ) ශ්‍රේණිය (ඈ) වැටුප් පරිමාණය හා දැන් ලබන මූලික වැටුප (ඉ) ස්ථිරද තාවකාලික ද, යන වග :—

(මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින්, (ආ) සිට (ඉ) දක්වා තොරතුරු සැපයිය යුතු නොවේ)

12. මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සැබෑ බවට ද නිවැරදි බවට ද, සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති විස්තර යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ පත්වීමට පෙර දැන ගන්නට ලැබුණොත් තෝරා ගැනීමට සුදුස්සකු නොවන බවද පත්වීමට පසු දැන ගන්නට ලැබුනොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට හා ඇතුලත්වනු ලබන ගිවිසුමට හා බැඳුම්කරය යටතේ දඬුවම් ලැබීමට යටත්වනු බවද මම දනිමි.

.................................................
අයදුම්කරුගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

13. අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් සම්පූර්ණ කළ යුතුය.

11 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය නිවැරදි බව හා ඔහුගේ සේවය මුළු කාලය තුළම සතුටුදායක බව මම සහතික කරමි. කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසිය අනුව (ඔහු තෝරා ගනු ලැබුවහොත්) වැඩ බලන පදනමක් මත ඔහු මුදා හැරීමට මම එකඟවෙමි/එකඟ නොවෙමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියා.

දිනය :————.

3–1247—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## ලංකා පිඟන් කර්මාන්ත සංස්ථාව

### විකුණුම් නිලධාරි තනතුර

ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—රජයේ ආයතනයක හෝ පිළිගත් වෙළඳ සමාගමක විකුණුම් පිළිබඳව පළපුරුද්ද සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක අර්ථශාස්ත්‍රය හෝ වාණිජ්‍ය උපාධියක්,

**හෝ**

රජයේ ආයතනයක හෝ පිළිගත් වෙළඳ සමාගමක විකුණුම් පිළිබඳ අවුරුදු 7 ක පළපුරුද්ද සහ අ. පො. ස. පත්‍ර විභාගයෙන් විෂයයන් 6 ක් සහිතව,

**හෝ**

රජයේ ආයතනයක හෝ පිළිගත් වෙළඳ සමාගමක විකුණුම් පිළිබඳ අවුරුදු 10ක පළපුරුද්ද සහ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය.

2. **වැටුප් පරිමාණය.**—මසකට රු. 500—40—820 සියළු දීමනා සහිතව.

3. **වයස.**—උපාධිධාරීන් අවුරුදු 30 ටත්, උපාධිධාරීන් නොවන්නවුන් අවුරුදු 35 ටත් අඩුවිය යුතුය.

4. තෝරාගනු ලබන අයදුම්කරු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත්, මතුවට පණවනු ලැබිය හැකිවූත් නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය. පරීක්ෂණාත්මක නියමිත කාලසීමාවෙන් පසු, තනතුරේ ස්ථිර කිරීම බලපවත්වනුයේ අනෙක් කරුණුත් සමඟ රාජ්‍ය භාෂා අවශ්‍යතාවයනට අනුකූලතාවය දැක්වුවහොත් පමණි.

5. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් ලියවිලි අවශ්‍ය විටෙක ඉදිරිපත් කළයුතුය :—

(අ) උප්පැන්න සහතිකය.
(ආ) උපාධියේ හෝ සමත්වූ උසස්ම විභාග සහතිකය.
(ඇ) චරිත සහතික දෙකක්.

6. රජයේ දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි සේවය කරන්නාවූ නිලධාරීන්ගෙන්වූ අයදුම්පත්, එම අය තෝරාගනු ලැබී නම් සේවයෙන් මුදාහැරිය හැකිවන බවට දන්වමින්, තම දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානීන් මඟින් එවිය යුතුය.

7. ඉල්ලුම්පත් නියමිත ආකෘති පත්‍රයෙහි පළවිය යුතුවන අතර, ආදර්ශ අයදුම්පතක් මෙහි යට දැක්වේ. අයදුම්පත් 1969 අප්‍රේල් මස 15 වන දින හෝ ඊට ප්‍රථම සාමාන්‍යාධිකාරීතුමා වෙත ලැබිය යුතුය.

පාලන කළමනාකරු,
ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

නො. 55, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 7.

## ආදර්ශ ඉල්ලුම්පත්‍රය

......................................... සඳහා වූ තනතුර

1. සම්පූර්ණ නම :————.
(අ) වාසගම :————.
(ආ) වෙනත් නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. උපන් ස්ථානය හා දිනය :————.

4. ජාතිය :————.

5. ඉගෙනුම ලැබූ පාඨශාලා, විද්‍යාල හා විශ්ව විද්‍යාලය( ඇතුලත්වූ හා අස්වූ දිනයන් සහිතව සඳහන් කරන්න.) :————.

6. වෘත්තීය හා ශාස්ත්‍රීය සුදුසුකම් (ගත් විෂයයන් සහ සුදුසුකම් ලබාගත් දිනයන් සඳහන් කරන්න.) :————.

7. පාසැලින් අස්වූ දින සිට කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (බැඳුණු දිනයන් හා අස්වූ දිනයන් සඳහන් කරන්න.) :————.

8. ලබා ඇති පුහුණුවීම් පිළිබඳ විස්තර දින සහිතව සඳහන් කරන්න :————.

9. ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ විස්තර (විශේෂයෙන් තමන්ගේ පළපුරුද්ද හා දැනීම පිළිබඳ විස්තර සඳහන් කරන්න) :————.

10. ඔබ පිළිබඳ තොරතුරු ලබාගත හැකි තිදෙනකුගේ නම්, ලිපිනය හා තනතුරු සඳහන් කරන්න—
(1) ————.
(2) ————.
(3) ————.

11. සහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ තනතුරු සඳහන් කරන්න (සහතික පත්‍ර ඉදිරිපත් කළයුත්තේ සම්මුඛ පරීක්ෂණයේ දීය.) :————.

12. වෙනත් කරුණු :————.

මෙම අයදුම්පතෙහි මවිසින් ප්‍රකාශ කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය බවට මෙයින් ප්‍රකාශ කරමි. මෙහි ඇති කරුණු වැරදි හෝ අසත්‍ය බව තෝරා ගන්නට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වේනවා පමණක් නොව, පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට සිදුවන බවද මම හොඳහැටි දනිමි.

(කිසිම පත්වීමකින් මා අස් කර නොමැති බවත්, උසාවියකින් වැරදිකරුවකු වී දඬුවම් ලබා නොමැති බවත් මෙයින් දන්වමි.)

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1263—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### මීගමුවේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය

### ධීවර අභ්‍යාස පාඨමාලාව—සිංහල මාධ්‍යය

1969 ජූලි මාසයේ දී ආරම්භ වන සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලබන ධීවර අභ්‍යාස පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කොට 1969 මැයි මස 15 වැනි දින හෝ ඊට පෙර හෝ මීගමුවේ සාන්ත සෙබස්තියන් පවු මාවතේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විද්‍යාලයාධිපති වෙත ලැබෙන සේ එවිය යුතුයි.

**2. විෂය ප්‍රමාණය සහ පුහුණුවීමේ කාලය :—** ධීවර ආම්පන්න, මසුන් මැරීමේ ක්‍රම, ඇන්ජින් ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම යන මේවා පුහුණු කරවීම මෙම පාඨමාලාවට ඇතුලත් වේ. මෙම පාඨමාලාව සඳහා ගතවන කාලය දළ වශයෙන් සමසකි. එක් පාඨමාලාවක් සඳහා අභ්‍යාස ලාභීන් 15 දෙනෙකුට ඉඩකඩ සැළසේ.

**3. පුහුණු කිරීමේ කොන්දේසි :**

(i) පුහුණුවීමේ කාල සීමාව තුලදී පුහුණුවන්නන් අභ්‍යාස මධ්‍යස්ථානයෙහි ම නැවතී සිටිය යුතුයි.

(ii) නොමිලේ ඉඳුම් හිටුම් සැළසෙතත් කොට්ට මෙට්ට, ඇඳ ඇතිරිලි ආදිය තමන්ම සපයා ගත යුතුයි.

(iii) පුහුණුවීම අවසාන කිරීමෙන් පසු රජය යටතේ රැකියාවක් ලබා ගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණුවන්නන් හට නොමැත.

(iv) පුහුණුවීමේ කාල සීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීති රීති පිළිපැදිය යුතුයි.

(v) පුහුණුවන්නන් ගෙන් ගාස්තු අය කිරීමක් නැත.

(vi) 1969 ජූලි මාසයේ ආරම්භ වන්නා වූ පාඨමාලාව සඳහා ඉගැන්වීමේ මාධ්‍යය සිංහලය.

(vii) මධ්‍යස්ථානයට අයත් අභ්‍යාස බෝට්ටු තුල මුහුදෙහි දී පරීක්ෂණ පවත්වා පෙන්වීම අභ්‍යාසයට ඇතුලත් වේ.

(viii) දිනකට රු. 2 ක යැපීම් දීමනාවක් අභ්‍යාස ලාභීන්හට ගෙවනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම් :—**

(1) මෙම අභ්‍යාස පාඨමාලාව සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකු විසින් ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) 69.5.15 වැනි දිනට වයස අවුරුදු 18 නො අඩු සහ අවුරුදු 30 ට නොවැඩි වේ.

(ආ) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශරීර සනීපයෙන් යුත් බව.

(ඇ) සිංහල කණිෂ්ඨ දක්වා ඉගෙනීම කර ඇති බව.

**සංලක්ෂ්‍යය :** උද්‍යෝගිමත් ධීවර කාර්මිකයින් වන්නා වූද එවැන්නන් ගේ දරුවන් වන්නාවූද, අයදුම්කරුවන් හට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. (1) අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නො වේ) තම අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) අයදුම්කරුගේ සහ ඔහුගේ පියාගේ රක්ෂාව කුමක්දැයි සඳහන් කොට ග්‍රාම සේවක තැන විසින් දෙන ලද සහතිකයක්.

6, නියමිත ස්ථානයකදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය. මෙයට අදාල ගමන් වියදම් හෝ වෙනත් කිසිවක් ගෙවනු නොලැබේ.

7. අභ්‍යාස පාඨමාලා ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

8. අයදුම්පත් සහ ඒවාට සියළු ලිපි ලේඛන එවිය යුත්තේ මීගමුවේ සාන්ත සෙබස්තියන් පවු මාවතෙහි ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විද්‍යාලයාධිපති වෙත විනා මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකු හට පුද්ගලිකව නොවේ.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 මාර්තු මස 16 වැනිදා,
ධීවර දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 531,
කොළඹ 3.

**අයදුම්පත් ආකෘතිය**

1. සම්පූර්ණ නම :—
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) 69.5.15 දිනට නියම වයස :—අවුරුදු :——, මාස :——දින : ————.
   (ආ) උපන් දිනය :————.
4. ජාතිය :————.
5. අයදුම්කරුගේ දැන් රක්ෂාව :————.
6. අයදුම්කරු රක්ෂාවෙහි නියුක්ත ස්ථානය :————.
7. අයදුම්කරු ධීවරයෙකු නම් :—
   (අ) මස් මැරීමේ ආකාරය :————.
   (ආ) බෝට්ටුවක් සහ/හෝ ආම්පන්න හිමියකු ද යන වග :————.
   (ඇ) යාන්ත්‍රික බෝට්ටු හිමියකු ද යන වග :————.
8. අයදුම්කරුගේ පියාගේ දැන් රක්ෂාව :————.
9. අයදුම්කරුගේ පියා රක්ෂාව කරන ස්ථානය :————.
10. අයදුම්කරු විවාහක ද, අවිවාහකද, වැන්දඹු පුරුෂයෙකු ද යන වග :————
   (විවාහක නම් දරුවන් ගණන සඳහන් කරන්න)
11. අධ්‍යාපනික සුදුසුකම් :————.
12. දැනට ලබා ඇති අභ්‍යාසයන් පිළිබඳ විස්තර :————.
13. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම පිණිස යම් විශේෂ හිමිකමක් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1075—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ධීවර දෙපාර්තමේන්තුව

### ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය—මීගමුව

### අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයන් පුහුණු කිරීමේ අභ්‍යාස පාඨමාලාව—සිංහල මාධ්‍යය

1969 ජූලි මාසයේදී ආරම්භ කෙරෙන අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයින් පුහුණු කිරීමේ සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන අභ්‍යාස පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම් පත් 1969 මැයි මස 15 වැනි දින හෝ ඊට පෙර මීගමුවේ, සාන්ත සෙබස්තියන් පවු මාවතේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විද්‍යාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතුය.

**2. විෂය ප්‍රමාණය හා පුහුණුවීමේ කාලපරිච්ඡේදය.—**

(1) පුහුණු කිරීමේ පාඨමාලාවට සමුද්‍ර ඇන්ජින් සර්විස් කිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, ක්‍රියා කරවීම, සිද්ධාන්ත සහ මූල ධර්ම පිළිබඳ පුහුණුවක් ලබාදීම ඇතුළත් වේ. මෙම පුහුණුකිරීමේ කාලපරිච්ඡේදය දළ වශයෙන් 6 මසකි. එක වරකට එක් පාඨමාලාවක් සඳහා පුහුණු වන්නන් **දසදෙනෙකුට ඉඩකඩ සැළසේ.**

**3. පුහුණු කිරීමේ කොන්දේසි.—**

(i) පුහුණුවීමේ කාල සීමාව තුළදී පුහුණුවන්නන් අභ්‍යාස මධ්‍යස්ථානයෙහිම නැවතී සිටිය යුතුය.

(ii) නොමිලයේ ඉඳුම් හිටුම් සැළසෙතත් කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි ආදිය තමන් ම සපයා ගත යුතුය.

(iii) පුහුණුවීම අවසාන කිරීමෙන් පසු රජය යටතේ රැකියාවක් ලබා ගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණුවන්නන් හට නොමැත.

(iv) පුහුණුවීමේ කාල සීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීති රීති පිළිපැදිය යුතුය.

(v) පුහුණුවන්නන්ගෙන් ගාස්තු අයකිරීමක් නැත.

(vi) පුහුණුකිරීමේ භාෂා මාධ්‍යය සිංහල වන්නේ ය.

(vii) දිනකට රු. 2 ක යැපීම් දීමනාවක් අභ්‍යාස ලාභීන්ට ගෙවනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම්.—** මෙම පුහුණුකිරීමේ පාඨමාලාව සඳහා අයදුම් පත් එවනු ලබන සෑම අයෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1969 මැයි මස 15 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 35 ට නොවැඩි බවට,

(ඈ) විශිෂ්ඨ චරිත ශුද්ධියකින් හා හොඳ ශරීර සනීපයකින් යුත් බවට,

(ඇ) ගරාජයක හෝ වැඩ පොළක දී ලබාගත් අවුරුදු 3 ක ප්‍රායෝගික යාන්ත්‍රික පළපුරුද්ද,

(ඈ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ සමාන සහතිකයක් හෝ ගණිතය විෂයයක් වශයෙන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් ලබාගත් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය.

5. අයදුම්පත් එවන්නන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය,

(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිත සහතික දෙකක්,

(ඈ) අයදුම්කරුගේ හා ඔහුගේ පියාගේ රැකියාවන් සඳහන් කරන ග්‍රාම සේවකගෙන් ලබාගත් සහතිකයක්,

(ඉ) තමන් විසින් ලබා ඇති යාන්ත්‍රික පුහුණුව පිළිබඳ සහතික.

6. නියමිත ස්ථානයකදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

7. අභ්‍යාස පාඨමාලා ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

8. අයදුම්පත් සහ මීට අදාල සියළු ලියකියවිලි එවිය යුත්තේ මීගමුවේ, සාන්ත සෙබස්තියන් පටුමාවතේ, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයෙහි විද්‍යාලයාධිපති නමින් මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකු හට පුද්ගලිකව නොවේ.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 531, කොළඹ.
1969 මාර්තු මස 16 වැනිදා.

**අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයින් (රෙපයාර් මිකැනික්වරුන්) පුහුණුකිරීමේ අභ්‍යාස පාඨමාලාව (සිංහල මාධ්‍යය සඳහා) ඉල්ලුම්කිරීමේ ආකෘති පත්‍රය**

1. සම්පූර්ණ නාමය :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නාමයන් :————.
2. ලිපිනය :————.
3. (අ) 1969 මැයි මස 15 වැනි දිනට වයස :————.
   අවුරුදු :——, මාස :——, දින:——.
   (ආ) උපන් දිනය :————.
4. ජාතිය :————.
5. අයදුම්කරුගේ දැන් රැකියාව :————.
6. අයදුම්කරු රැකියාවෙහි නියුක්ත ස්ථානය :————.
7. අයදුම්කරු විවාහකද, අවිවාහකද, භාර්යාව මළ පුරුෂයෙක්ද ? යන වග :————.
   (විවාහක නම් දරුවන් ගණන සඳහන් කරන්න)
8. අධ්‍යාපනික සුදුසුකම් :————.
9. අයදුම්කරු විසින් ලබා ඇති යාන්ත්‍රික පුහුණු පිළිබඳ තොරතුරු :————.
10. මෙම අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීමට යම් විශේෂ හිමිකමක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

**දිනය :————.**

3–1076—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/23/2/18 (ජී)

**සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය—1969 මාර්තු**

යථෝක්ත විභාගය පිළිබඳව, 1969 ජනවාරි 9 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 ජනවාරි 3 වැනි දින දරණ නිවේදනයේ 2 වැනි ඡේදය සම්බන්ධයෙනි. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පුරවනු ලබන ඇබෑර්තු සංඛ්‍යාව දළ වශයෙන් 110 ක් බව විභාගාපේක්ෂකයන්ගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 මාර්තු මස 17 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

3–1133—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

1969 පෙබරවාරි මස 21 වෙනි දින,
කුන්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ දීය

**කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයීය 1968 අවසාන පරීක්ෂණයේ ප්‍රතිඵල**

**පළමුවැනි පෙළ සාමාර්ථයන්—**

1. ද සිල්වා, ඩබ්ලිව්. ආර්. මෙනෙවිය, (විශිෂ්ඨ සාමාර්ථයන්—1. ගෙවතු වගාව, සතුන් ඇතිකිරීම හා මීමැසි පාලනය, 2. පෝෂණය, සූප ශාස්තරය හා ආහාර කල්තබා ගැනීම, 3. ස්වස්ථතාව, දාරකාරක්ෂාව ප්‍රථමාධාර හා ගිලන් උවටැන්.)
2. පොන්සේකා, එස්. එන්. මෙනෙවිය. (විශිෂ්ඨ සාමාර්ථයන්—1. වී වගාව, 2. බෝග නිෂ්පාදන මූලධර්ම)
3. ඉසුමා ලෙබ්බේ, එස්. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්—1 කෘෂිකර්ම මූලධර්ම. 2. බෝග නිෂ්පාදන මූලධර්ම).
4. කදිරමලෙයි, වී. මයා, (විශිෂ්ඨ සාමාර්ථයන්—1. උද්‍යාන විද්‍යාව මූලධර්ම හා තවාන් පාලනය).
5. කුමාර ගුණරත්නම්, එස්. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්—1. කෘෂිකර්ම මූලධර්ම. 2. වී වගාව. 3. බෝග නිෂ්පාදන මූලධර්ම. 4. වියලි කලාපීය කන්න බෝග. 5. තෙත් කලාපීය කන්න බෝග. 6. වතු බෝග).
6. මොහොමඩ් හනීපා මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. කෘෂිකර්ම මූලධර්ම. 2. වී වගාව, 3. බෝග නිෂ්පාදන මූලධර්ම).
7. නන්දවතී, ඩබ්ලිව්. එච්. මෙනෙවිය. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. කෘෂිකර්ම මූලධර්ම. 2. වී වගාව).
8. පියදස, එම්. පී. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. කෘෂිකර්ම මූලධර්ම. 2. බෝග නිෂ්පාදන මූලධර්ම. 3. වතුබෝග).
9. සිරිපාල, පී. ජී. මයා, (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. වියලි කන්න බෝග).
10. සිරිසේන, ඩී. ටී. ජී. එස්. මයා, (විශිෂ්ඨ සාමාර්ථයන්—1. සත්ව පෝෂණය. 2. කිරිපට්ටි පාලනය. 3. කුකුළන් ඌරන් හා එළුවන් ඇති කිරීම).
11. සෝමරත්න, කේ. ඩී. මයා, (විශිෂ්ඨ සාමාරථයන්.—1. වී වගාව. 2. සත්ව පෝෂණය, 3. කිරිපට්ටි පාලනය).
12. ත්‍යාගරාජා, වී. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. වී වගාව)
13. වීරසිංහ, ඩබ්ලිව්. එම්. ජී. මයා.

**දෙවන පෙළ සාමාර්ථයන්.—**

1. අබේසේකර, එස්. සී. මෙනෙවිය.
2. අබේරත්න, පී. ආර්. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. මල් වැවීම හා මී මැසි පාලනය).
3. ආලාලසුන්දරම්, වී. මයා.
4. අනුලාවතී, වයි. පී. මෙනෙවිය
5. අමරසිංහ, ආර්. එම්. පී. මෙනෙවිය, (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. මැහුම් වැඩ, ඇඳුම් මැහීම හා අත්වැඩ).

6. ආරියවතී, ඒ. ටී මෙනෙවිය
7. ඇලෙක්සැන්ඩර් ඩේසි, කේ. ඒ. මෙනෙවිය
8. බණ්ඩා, පී. කේ. මයා.
9. චන්ද්‍රසේන, එම්. ජී. මයා.
10. ද සිල්වා, එච්. එච්. ඩී. මයා.
11. ඩයස්, එම්. එල්. සී. ඒ. මයා.
12. දහනායක, සී. ඒ. එස්. මෙනෙවිය
13. එගොඩපිටිය, ඊ. එල්. මයා.
14. ඒකනායක, එන්. ඩබ්ලිව්. මයා.
15. ඊශ්වරී දේවී, පී. මෙනෙවිය, (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. පෝෂණය, සූප ශාස්ත්‍රය, ආහාර කල්තබා ගැනීම).
16. ප්‍රනාන්දු, එල්. ඒ. එස්. මයා.
17. ප්‍රනාන්දු, එච්. එස්. මයා.
18. ප්‍රනාන්දු, එම්. සී. මයා.
19. ගුණපාල, වයි. පී. මයා.
20. ගුණවර්ධන, ඒ. පී. එස්. මෙනෙවිය
21. ඥාණරත්නම්, ඒ. මෙනෙවිය. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. පෝෂණය, සූප ශාස්ත්‍රය හා ආහාර කල්තබා ගැනීම. 2. මැහුම් වැඩ, ඇඳුම් මැහීම හා අත් වැඩ).
22. ගුණසේකර, එස්. එම්. ඩී. එල්. ටී. මෙනෙවිය
23. හේමලතා මැණිකේ, එච්. ආර්. මෙනෙවිය
24. හේරත්, එච්. එම්. පී. මයා.
25. හපුගොඩ, කේ. එම්. ජී. එම්. මයා.
26. හෙට්ටි ආරච්චි, එස්. මෙනෙවිය
27. හීන් මැණිකේ, එච්. එම්. මෙනෙවිය, (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. ගෙවතු වගාව, සතුන් ඇතිකිරීම හා මීමැසි පාලනය, 2. පෝෂණය, සූප ශාස්ත්‍රය හා ආහාර කල්තබා ගැනීම).
28. හේරත්, එච්. එම්. ඩබ්ලිව්. මෙනෙවිය
29. ජයසේන, අයි. ඩී. මයා.
30. ජයසුන්දර, එල්. අයි. එස්. මෙනෙවිය
31. කුමාරසාමි, ඒ. මයා.
32. කරුණාවතී, එම්. මෙනෙවිය
33. කුසුමාවතී, කේ. පී. මෙනෙවිය
34. ලලිතා පියසීලී, බී. ඩී. මෙනෙවිය
35. මෙල්කි, සෙදෙත්, ඩබ්ලිව්. ඩී. එන්. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. කිරි පට්ටි පාලනය).
36. මැදගම උපාලි, ආර්. ආර්. එම්. ආර්. මයා.
37. මහේස්වරී, කේ. මෙනෙවිය
38. මුදියාන්සේ මහකුඹුර, එල්. එම්. මයා.
39. මිත්‍යානන්දම්, පී. මයා.
40. නිහාල් නෝනිස් මයා.
41. නවරත්නම්, ආර්. මයා.
42. නන්දනසිංහ, ටී. ඒ. මයා.
43. නන්දාවතී, ඩී. එම්. පී. මෙනෙවිය
44. පෙරේරා, එම්. පී. මයා.
45. ප්‍රේමවතී, ආර්. පී. මෙනෙවිය
46. ප්‍රේමසිරි, එල්. ඩී. මයා.
47. පියසේන, ඒ. එම්. මයා.
48. පෙරේරා, කේ. ජේ. මයා.
49. පරම සුන්දරි, එම්. මෙනෙවිය
50. පොඩිමැණිකේ, යූ. ආර්. සී. මෙනෙවිය
51. රාජකුමාරි, එස්. මෙනෙවිය
52. රාජ රන්ජනී, වී. මෙනෙවිය, (විශිෂ්ඨ සාමාර්ථය.—1. පෝෂණය, සූප ශාස්ත්‍රය හා ආහාර කල්තබා ගැනීම).
53. සුසයිතාසන්, පී. මයා.
54. සන්තියා පිල්ලෙයි, එස්. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. කෘෂිකර්ම මූලධර්ම).
55. සිරිපාල, ඒ. ඇම්. මයා.
56. සේනානායාක, ඊ. එම්. මයා.
57. සිල්වා, එම්. ඒ. මයා.
58. සෝමාවතී මැණිකේ, ආර්. එම්. මෙනෙවිය, (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. පෝෂණය, සූප ශාස්ත්‍රය හා ආහාර කල්තබා ගැනීම).
59. සමරවික්‍රම, එස්. මෙනෙවිය
60. සෝමලතා, අයි. එල්. ජී. මෙනෙවිය
61. සිවකුලන්දු, එස්. මෙනෙවිය, (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. පෝෂණය, සූප ශාස්ත්‍රය හා ආහාර කල්තබා ගැනීම).
62. තෙන්නකෝන්, ඒ. එම්. බී. මයා.
63. තිලකරත්න, කේ. ඒ. යූ. මයා.
64. උකුවෙළ, එච්. ආර්. බී. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. වතු බෝග)
65. වේලුපිල්ලේ, එස්. මයා.
66. විජේසූරිය, එම්. ඒ. මයා.
67. විමලසේන, ටී. බී. මයා.
68. වීරසිංහ, එල්. එම්. මෙනෙවිය
69. වම්බටුවැව, ඩබ්ලිව්. එම්. ඩී. බී. මයා.
70. වීරසූරිය, ඩී. ඒ. මයා.
71. වික්‍රමනායක, එම්. මෙනෙවිය
72. යෝගලිංගම්, ඒ. මයා. (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. කිරි පට්ටි පාලනය)
73. ලෝගේන්ද්‍රම්, කේ. මයා, (විශිෂ්ඨ සාමාර්ථයන්.—1. උද්‍යාන විද්‍යා මූලධර්ම හා තවාන් පාලනය).
74. යටිවැල්ල, ඩබ්. බී. මයා.

සාමාන්‍ය පෙළ සාමාර්ථයන්.—

1. බාලේන්ද්‍රම්, පී. මයා.
2. ප්‍රනාන්දු, පී. එච්. ඩී. මයා.
3. හීන් මැණිකේ, ටී. එම්. මෙනෙවිය
4. ජයසේන, යූ. ජී. මයා.
5. කොතලාවල, ආර්. පී. ඩබ්ලිව්. මෙනෙවිය
6. කරුණාරත්න, කේ. ඩබ්ලිව්. සී. මෙනෙවිය
7. ලියනආරච්චි, සී. පී. මෙනෙවිය
8. ලලිතා, එල්. එම්. මෙනෙවිය
9. මයිල්වාගනම්, පී. මයා.
10. පතිරාජා, පී. එම්. එස්. මයා.
11. සේනක සොයිසා, ජේ. මයා.
12. විරසිංහ, ඩබ්ලිව්. එම්. ඒ. මෙනෙවිය

ඌණ සාමාර්ථයන්.—(පළමුවෙනි කොටස)

1. අමරසිංහ, එම්. මයා.
2. බන්ධුසිරි, එස්. එච්. මයා.
3. බෝයගොඩ, එච්. ඒ. මයා.
4. වෙරුබීම්, එස්. ඒ. මයා.
5. චන්ද්‍රතිලක, එස්. ආර්. එම්. ජී. ආර්. මයා.
6. පායිවා, ඒ. ආර්. මයා.
7. ඉලංගසිංහ, එම්. එම්. මෙනෙවිය
8. නිල්ලේගොඩ, එම්. මයා.
9. පොඩි මැණිකේ, ආර්. එම්. මෙනෙවිය
10. පවලරානී, එස්. මෙනෙවිය
11. පුෂ්පරාජා, ඒ. එස්. මයා.
12. රත්නායක, එස්. බී. එස්. මයා.
13. උම්මුසල්මා මෙනෙවිය

ඌණ සාමාර්ථයන්.—(දෙවෙනි කොටස)

1. අනුලාවතී, ඩී.
2. අබේසේකර, ඒ. එච්. මයා.
3. ඩිංගිරි අප්පුහාමි, එච්. එම්. මයා.
4. ද සිල්වා, ඒ. පී. මයා.
5. ද සිල්වා, කේ. එන්. මයා.
6. හන්නාගල රංජිත් මයා.
7. ඉලංගසිංහ, ඩී මයා.
8. ජයනෙත්ති, ආර්. මයා.
9. කුරේරා, ඒ. එච්. බී. මයා.
10. ලැටීෂියා, ඒ. මෙනෙවිය
11. නිකලස්, කෘස් මයා.
12. රන්දෙණි, පී. ඊ. එස්. මයා.
13. සහරන්දෙණිය, පී. බී. එස්. එස්. මයා.
14. සෝමදාස, එච්. ඩී. මයා.
15. තම්බිරාජා, එස්. මයා.
16. විල්යම්බලම්, ආර්.

පහත සඳහන් අය කලින් රෙගුලාසි අනුව විභාගය සම්පූර්ණ කර ඇත :—

1. ඩිංගිරි බණ්ඩා, ටී ඒ. කේ. මයා.
2. ගුණවර්ධන, එස්. ඒ. පී. මයා.
3. ජයසේකර, ජී. බී. ඒ. මයා.
4. කනගසබේ, එම්. මයා.
5 කන්දයියා, එස්. මයා.
6. කන්දසාමි, කේ. මයා.
7. කනපතිපිල්ලේ, ටී. මයා.
8. රණතුංග, ටී. බී. මයා.
9. වික්‍රමසිංහ, ඩබ්ලිව්. ඩී. එස්. ටී. බී. මයා.

ඊ. නානායක්කාර,
විදුහල්පති.

කෘෂිකර්ම විද්‍යාලය,
කුණ්ඩසාලේ,
1969 පෙබරවාරි මස 21 වැනි ද.

3–1050—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

**ආසියා සංවර්ධන බැංකු ණය මුදලින් හේ වතු 150 කට විදුලිය සැපයීම සඳහා බඩු බාහිරාදිය සැපයීම**

ඉහත සඳහන් කාර්යය සඳහා බඩු සැපයීම් වස් ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මඩුල්ලේ සභාපති (කොළඹ, තැ. පෙ. 500) විසින් 1969 ජූලි මස 1 වන අඟහරුවාදා පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. නිකුත් කිරීමේ නිලධාරීන්ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් කොන්දේසි, විශේෂ විස්තර යනාදිය අනුවය ටෙන්ඩර් හැකසිය යුත්තේ.

3. සාමාන්‍ය ටෙන්ඩර් කොන්දේසිවල සඳහන් මුදල් ගෙවීමේ කොන්දේසිවලට ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ආසියා සංවර්ධන බැංකුවේ සාමාජික රටවල නිෂ්පාදකයින්ගෙන් පමණකි.

4. ටෙන්ඩර් පොත් නිකුත් කරනුයේ 1969 ජූනි මස 26 වන දින පෙ. ව. 2 දක්වායි. ටෙන්ඩර් ගාස්තුව වන රු. 125 ගෙවූ විට ටෙන්ඩර් පොත් 3 ක් ලබාගත හැක. එයට වැඩිපුර එක කොපියක් සඳහා රු. 40 ක් අයකරනු ලැබේ. ටෙන්ඩර් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**5. ටෙන්ඩර් පොත් මිලදී ගැනීම හා විස්තර දැන ගැනීම—**

(අ) මෙරට : කොළඹ 2, තැ. පෙ. 540, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවත, විදුලි දෙපාර්තමේන්තුව, කොන්ත්‍රාත් හා සැපයීම් ඉංජිනේරුවන්ගෙනි.

(ආ) ටෙන්ඩර් පොත්වල විස්තර පමණක් ආසියා සංවර්ධන බැංකුවේ සාමාජික රටවල ලක් රජයේ නියෝජිතයන්ගෙන් දැන ගැනීමට පුළුවන් වන අතරම, ලංකා මුදල් රු. 125 කට සමාන මුදලක් එම රටවල මුදලින් ගෙවා මෙම දැන්වීමේ පස්වන ඡේදයේ (අ) යටතේ දැක්වෙන ලිපිනයට පිහිටි එවූ විට ටෙන්ඩර් පොත් ලබාගත හැකි වේ.

6. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයිනට හෝ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටිය හැක. ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන්නේ 1969 ජූලි මස 1 වන අඟහරුවාදා පෙරවරු 10 ට, කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ ඉඩම්, වාරිමාර්ග හා විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ කාර්යාලයේ දීය.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ,
වැඩ බලන ප්‍රධාන කළමනාකාර නැන.

1969 මාර්තු 28 දින,
තැ. පෙ. 540, කොළඹ 2,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ දීය.

3–1046—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**දැන්වීමයි**

වාලච්චේනෙයිහිදී සිදුකළ යුතු මෙහි පහත දැක්වෙන කාර්යයන් ඉටුකරනු සඳහා, පිළිගත්, පළපුරුදු හා ලියාපදිංචිව ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිළ ගණන් කැඳවේ :—

(1) කල්ක ගබඩාව විශාල කිරීම
(2) ඉංජිනේරු වැඩපළෙහි වැසි දියුණු කිරීම.

මිළ ගණන් ආකෘති පත්, වගන්ති හා කොන්දේසි සටහන්, ප්‍රමාණිත බිල්පත්, හා අනිකුත් විස්තර, මෙම කාර්යාලයට ලියා අයදුම් කර ලබා ගත හැක.

සාමාන්‍ය කාර්ය වේලාවල මෙම කාර්යාලයේදී සැලසුම් පරීක්ෂා කර බැලීමට පුලුවන.

පිටපත් දෙකකින් දැක්විය යුතු මිළ ගණන්, විස්තර දැනගත හැකි අයුරුත් සඳහන් කර, මුද්‍රා තබා, 1969 අප්‍රේල් 7 වෙනි දින පස්වරු 2 ට පෙර, මෙහි පහත අත්සන් කරන අයට ලැබෙන සේ "ධානෝ ගොඩනැගිලි සඳහා මිළ ගණන්" යනුවෙන් කවරයේ සඳහන් කර එවිය යුතුය.

නි. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

කොළඹ 2,
යුනියන් පෙදෙසේ අංක 135 දීය.
1969. 3. 22.

3–1107/1—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**ටැන්ඩර් දැන්වීමයි**

වාලච්චේනෙයිහි නැගෙනහිර කඩදාසි කම්හලට, රීල් වශයෙන් යුත් ග්‍රාෆ්ට් කඩදාසි දිග ටොන් 1,500 (දිග ටොන් 1, රා. 2,240) සැපයීම සඳහා ටැන්ඩර් කැඳවනු ලැබේ.

.69.6.16 පස්වරු 2.00 ට ටැන්ඩර් භාරගැනීම අවසන් කෙරේ.

.මූලිකයන්ගේ/සැපයුම්කරුවන්ගේ නම් හා ලිපිනයන් සඳහන් කර අයැදි විට ටැන්ඩර් ආකෘතිපත් හා අනිකුත් විස්තර ලබා ගත හැක.

නි. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

කොළඹ 2,
යුනියන් පෙදෙසේ අංක 135 දීය.
1969. 3. 22.

3–1107/2—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය

**ටෙන්ඩර් දැන්වීමයි**

1969-70 වර්ෂයේදී මේස එනු ඇසිරීමට අවශ්‍ය රැලි දැමූ කාඩ්බෝඩ් පෙට්ටි 10,000 ක් සැපයීමට ටැන්ඩර් කැඳවනු ලැබේ. ටැන්ඩර් භාර ගැනීම අවසන් වන්නේ 1969 අප්‍රේල් 18 දින පෙරවරු 9.30 ටයි. වැඩි විස්තර සංයුක්ත මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක.

සභාපති.

පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය,
තැපැල් පෙට්ටිය අංක 1489,
21, අබ්දුල් කපූර් මාවත,
කොළඹ 3.

3–1191—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—යාපනය උප කොටස

යාපනය උප කොටසේ අක්කරායන්කුලම් ව්‍යාපාරයේ පහත මට්ටමේ බැම්මේ රොක් ටෝ පිල්ටර් නිර්මාන වැඩ සඳහා 1969 අප්‍රේල් මස 18 වැනි දින (සිකුරාදා) පෙරවරු 10 තෙක් වවුනියාවේ උතුරු කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු නැන විසින් භාර ගනු ලැබේ.

2. රුපියල් 75,000 කට හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඇති, කොන්ත්‍රාත්කරුවන්, සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති පමණක් මෙම කාර්යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

3. 1969 අප්‍රේල් මස 14 වැනි දින පස්වරු 3 දක්වා කාර්යාල වේලාවන්හි යාපනය, මන්නාරම, වවුනියාව, මුලතිව්, වවුනික්කුලම් යන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලින් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් පත් සඳහා අයදුම් කිරීමේ දී, ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ස්වකීය ලියාපදිංචි පොත් සහ දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩ දීම සුදුසුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු නැන වෙත ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදල් යථෝක්ත ඕනෑම වාරිමාර්ග ඉංජිනේරු නැනගේ කාර්යාලයක තැන්පත් කිරීම හෝ එම මුදල කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීම කළ යුතුය.

4. මෙම සම්බන්ධ වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී, කිළිනොච්චියේ, යාපනය උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු නැනගෙන් ලබා ගත හැක.

ඇස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු,
යාපනය උප කොටස.

කිළිනොච්චිය, 1969.3.12 වැනි දින.

3–1128—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## විලිස් ස්ටේෂන් වැගන් රථයක් විකිණීම

කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලයේ කළමනාකාර තැන විසින් කොළඹ 7, විජේරාම මාවතේ අංක 30 දරන ස්ථානයේ තබා ඇති විලිස් ස්ටේෂන් වැගන් රථය මිලදී ගැනීමට සා රැගෙන යාමට 1969 අප්‍රේල් මස 17 දා පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

අවශ්‍ය වෙනත් විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

කළමනාකාර තැන.

කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1179,
අංක 30, විජේරාම මාවත,
කොළඹ 7.

3—1237—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කුරුනගර් මධ්‍යම බෙහෙත් ශාලාව සහ මාතෘ නිවාසයට මාසිම් තාප්පයක් සහ ගේට්ටුවක් තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, යාපනය, ර. වැ. දෙ. අධිකාරි ඉංජිනේරුතැනගේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 27 වැනි ඉරිදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. යාපනය රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිට පතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිවන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 13,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ස. පත්මනාදන්,
අධිකාරි ඉංජිනේරු, උ. කො.

අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
යාපනය, 1969.3.16.

693–1073—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගරාජ් සහ අළුත්වැඩියා උපකරණ සැපයීම

(ඇම්. එස්. 686947)

ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් අංක 14,838 සහ 69.1.24 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් කැඳවන ලද ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 69.4.29 වෙනි දින ප. ව. 2.30 තෙක් ද ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීම 69.4.22 වෙනි දින දවල් 12 තෙක් ද දීර්ඝ කොට ඇත.

ඇල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

69.3.28 වෙනි දින,
පේරාදෙනියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

3–1136—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

1969 මාර්තු 14 වැනි දින රජයේ ගැසට් පතෙහි පළ වූ දැන්වීමට වැඩි දුරටත්, විකිණීමට ඇති ධාන්‍ය ප්‍රමාණය පහත සඳහන් අයුරු සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි :—

වියළි මිරිස් (III වෙනි වර්ගය) හොණ්ඩර 49යි.

කුරක්කන්, (III වෙනි වර්ගය) කාර්තු 2යි.

සී. වී. උනම්බුව,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 මාර්තු 14 වැනිදා,
කොළඹ 7, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

3–1136—69.3.28 දින අංක 14,847 දරන පැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොලොන්නරුව මධ්‍යම සත්ව පර්යේෂණ ගොවිපලෙහි ගව පැටවුන් සඳහා මඩු 2ක් සහ ගව ආහාර ගබඩාවක් තැනීම

පොලොන්නරුව මධ්‍යම සත්ව පරේයේෂන ගොවිපලෙහි ඉහත සඳහන් ගොඩනැගිලි තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.4.22 වෙනි දින පස්වරු 2.30 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457, දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළි යෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද, ලබාගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රු. 75,000 කට ගොඩනැගිලි කොන්ත්‍රාතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලිය කිය විලි ඉදිරිපත් කල විට 1969.4.11 වෙනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969.3.20 වෙනි දින,
කොළඹ 3, ගාලු පාරේ,
අංක 457, දරණ ගොඩනැගිල්ලේ පිහිටි,
සිවිල් ඉංජිනේරු කාර්යාලයේ දීය.

3–1262/1—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව—මහනුවර දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර්

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

1. හාරිස් පත්තුව, චතුවෙල වනල ඇල වේල්ල ප්‍රතිසංස්කරණය.
2. හාරිස් පත්තුව, කහවත්ත අස්සැද්දුම යායට වාරිමාර්ග පහසුකම් සැපයීම.
3. හාරිස් පත්තුව, බන්ඩි කුඹුරේ ඇල වේල්ල ප්‍රතිසංස්කරණය.
4. හාරිස් පත්තුව, වල්දෙනිය මාරත්ත ඇල වැඩිදියුණුව.
5. පාතදුම්බර, යටවර, ගැලිමුරේ ඇල වැඩිදියුණුව.
6. පාතදුම්බර, හුරිකඩුව, මහරවෙල ඇල සහ අමුණ ප්‍රතිසංස්කරණය.
7. පාතදුම්බර, දොඩම්ගස් පැලේ ඇල ප්‍රතිසංස්කරණය.
8. ගලගෙදර, පහලගම, මූරුතගහමඩ ඇල නඩත්තුව.
9. යටිනුවර, ගන්නොරුව ලිදේ ලියද්ද කුඹුරේ ඇල වේල්ල.
10. යටිනුවර, උඩ ඊරියගම මැදඇල අලුත් වැඩියාව.
11. යටිනුවර, පැලව හීංලියද්ද ඇල ගංවතුර හානිය.
12. යටිනුවර, යහලතැන්න, තොටකුඹුර ඇලවේල්ල ප්‍රතිසංස්කරණය.
13. යටිනුවර, යටිගම්මන ලියන්වෙල ඇල සෑදීම.
14. යටිනුවර, දෙහිඅංග අස්සැද්දුමේ ඇල ගුරුඔය දක්වා දික් කිරීම.
15. යටිනුවර, ඒදඬුවාවේ පුස්සේ කුඹුරේ ඇලවේල්ල තැනීම.
16. යටිනුවර, දෙඩම්වෙල කුඩුගල ගාවා අමුණ තැනීම.
17. යටිනුවර, පැලව පහලගම දුම්මල දෙනිය කුඹුරේ ඇලවේල්ල සෑදීම.
18. යටිනුවර, පිච්චවැල්දෙනියේ ඇලවේල්ල බැඳීම.
19. යටිනුවර, පොත්ත පිටිය කන්දේවල ඇල අලුත්වැඩියාව.
20. යටිනුවර, ගල්අංග ඇලේ හදිරංකුඹුර ඇල වේල්ල.
21. යටිනුවර, කොටලිගොඩ වැලිපැලේ ඇලේ හියුම් බට දැමීම.
22. යටිනුවර, හලියද්ද දිය ඇඩියාවේ ඇල වැඩිදියුණුව.
23. යටිනුවර, රත්මීවල රදාපෙන්නේ අමුණ තැනීම.
24. යටිනුවර, උඩුවෙල අටලාගේ අමුණ සහ ඇල සෑදීම.
25. යටිනුවර, පැලව කෝවිල ලඟ අමුණ තැනීම.
26. යටිනුවර, මාමුංඩාවල වැලිපැලේ අමුණ තැනීම.
27. යටිනුවර, මාමුංඩාවල වැලිකුඹුරේ ඇල හැරවීම.
28. උඩබුලත්ගම, බව්වාගම ගල්ඔය අමුණ වැඩිදියුණුව.
29. උඩබුලත්ගම, වැලිගම්පොල මැදවෙල්යායේ ඇල ප්‍රතිසංස්කරණය.
30. උඩබුලත්ගම, මැඩිල්ල, කොන්බේරිය අමුණ තැනීම.
31. උඩපලාත, හැරකොල වම්ඇල වැඩිදියුණුව.
32. උඩපලාත, උලපනේ මුත්තෙට්ටුවේ අමුණ ඇල සෑදීම.
33. උඩපලාත, උඩහේන්තැන්නේ හල්ගොල්ලේ අමුණ දියුණු කිරීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ක්වූ අප්‍රේල් මස 15 දින දවල් 12 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ වම් කෙළවරේ "........................ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969ක්වූ අප්‍රේල් මස 17 දින පෙරවරු 9.30 ට පෙර මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමක් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩරය භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයන්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 අප්‍රේල් මස 17 දින පෙ. ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. පී. ඇම්. විජයදෝරු,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

මහනුවර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1969 මාර්තු මස 13 දින දීය.

3–1140—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

1969 මැයි මස 1 වැනි දින සිට අවුරුද්දක කාලයක් තුළ පහත දැක්වෙන උපලේඛනයේ අන්දමට සුළු ආහාරයක් සමග කිරි තේ සැපයීම හා බෙදා හැරීම සඳහා ටෙන්ඩර් මෙයින් කැඳවනු ලැබේ:—

(අ) සාමාන්‍යයෙන් සැතපුම් 6 ක් ආවරණය වන එලිසබෙත් රැජින පාලමේ සිට විජය පාලම දක්වා වරාය පෙදෙස තුළ ස්ථාන 8 ක සේවක මහතුන් 35 දෙනෙකුට පමණ පස්වරු 5 ට,

(ආ) වරාය පෙදෙස සිට සාමාන්‍යයෙන් සැතපුම් 6 ක් ආවරණය වන මැක්ලම් ගේට්ටුව සහ කොලොන්නාව සේවක මහතුන් 14 දෙනෙකුට පමණ පස්වරු 5 ට,

(ඇ) සාමාන්‍යයෙන් සැතපුම් 10 ක් ආවරණය වන වරාය පෙදෙස තුළ ස්ථාන 50 ක සේවක මහතුන්ට 200 ක් පමණ, මධ්‍ය රාත්‍රී 12 ට,

(ඈ) සාමාන්‍යයෙන් සැතපුම් 10 ක් ආවරණය වන බ්ලූමැන්ඩල්, මෝදර, නාගලම් වීදිය, ග්‍රෑන්ඩ් පාස්, උඟරුගොඩවත්ත, කොලොන්නාව සහ මීතොටමුල්ල සේවක මහතුන් 34 දෙනෙකුට පමණ, මධ්‍යම රාත්‍රී 12 ට,

(ඉ) සාමාන්‍යයෙන් සැතපුම් 3 ක් ආවරණය වන වින්සන්ට් වීදිය, සාන්ත සෙබස්තියන් දොරටුව, මැක්ලම් පාර හරහා මරදාන සේවක මහතුන් 15 ට පමණ මධ්‍ය රාත්‍රී 12 ට.

2. සුළු ආහාරයක් හා කිරි තේ එකක අනුමත කරන ලද මුදල ශත 40 කි.

3. දිනපතා සැපයීමට අදහස් කරන සුළු ආහාරයන් මොනවාද යන්න වර්ග කර ටෙන්ඩර්කරුවන් විසින් දැක්විය යුතුය.

**සටහන :** බෙදාහැරීමේ ස්ථානයන් හා ආහාර වේල් ගණන කලින් කලට වෙනස් වීමට ඉඩ ඇති අතර සපයන ලද මුළු ආහාර වේල් වෙනුවෙන් ගෙවීම් කරනු ලැබේ.

4. බෙදා හැරීමේ ස්ථානයන් පරීක්ෂාකර බැලීමට ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම්, මේ සඳහා කොළඹ වරාය කොමිෂම් සභාවේ පාලක ලේකම් කාර්යාලයට පැමිණෙන්න.

5. ටෙන්ඩර් බාරගන්නා අන්තිම දිනය 1969 අප්‍රේල් මස 15 දින දහවල් 12 දක්වාය.

6. "තේ ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කර සීල් තබන ලද ටෙන්ඩර් ලේඛනගත තැපෑලෙන් වරාය කොමසාරිස් වෙත එවිය යුතුය. එසේ නැතිනම් කොළඹ වරාය කොමිෂන් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරුතැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් පත්‍රය දැමිය යුතුය.

වී. සී. ප්‍රනාන්දු,
වරාය කොමසාරිස් වෙනුවට.

වරාය කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1. 1969 මාර්තු මස 20 දින.

3–1245—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 මැයි මස 14 වෙනි බදාදා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට මෘදු වානේ තහඩු 144 ක් (20×6×5/16" තහඩු 22 ක්, 20×6×1/2" තහඩු 22 ක් සහ 20×6×3/8" තහඩු 100ක්) සපයා භාර දීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ. 1969 මැයි මස 14 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳ එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1969 මැයි මස 12 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1969.3.20.

3–1243—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## ගාල්ල දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීම

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් හා විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කොන්ත්‍රාත් කරුවන් හැටියට ලියාපදිංචි වී ඇති අනිකුත් සමුපකාර හා කොන්ත්‍රාත් කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| | කර්මාන්තයේ නම | ගො. ක. ස. ප්‍රදේශය | ග. ව. නි. ප්‍රදේශය |
|---|---|---|---|
| 1. | දනව්විල පිටවාන ප්‍රතිසංස්කරණය | ගහලකොලදෙනිය | ගාල්ල |
| 2. | යගල්දූව අමුණ වැඩිදියුණු කිරීම | බොරළුකඩ | එම |
| 3. | කැන්දකැටිය ගුලනවිල පිටවාන දියුණු කිරීම | ගෝනලගොඩ–ගම්මැද්දෙගොඩ | උඩුගම |
| 4. | බණ්ඩියකුඹුර ගොඩ ඇල ප්‍රතිසංස්කරණය | එම | එම |
| 5. | ආඳාදෙල අමුණ අංක 1 ට ලෑලි සැපයීම | නාගොඩ–කුරුපණාව | එම |
| 6. | පල්ලෙගහයායේ අමුණ තැනීම | උක්ඹවිට | එම |
| 7. | ඉඹුල්ගහවෙල ඇල ප්‍රතිසංස්කරණය | හිපන්කන්ද | බෙන්තර |
| 8. | වීරසේකර වැලිගොඩැල්ල දෙපාඇල තැනීම | අතුරුවැල්ල | එම |
| 9. | ඕපාත යාය පාලකය තැනීම | ඕපාත | ඇල්පිටිය |
| 10. | කළුගල්විල යාය ඇල ප්‍රතිසංස්කරණය | තණබද්දේගම | අම්බලන්ගොඩ |
| 11. | ඉඳගහ උඩුමුල්ල ඇල ප්‍රතිසංස්කරණය | අහුළුගල්ල | එම |
| 12. | දික් ඇල ප්‍රතිසංස්කරණය | ඇත්කඳුර | එම |

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගෙන ඇති ආකෘතිපත්‍ර වලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘතිපත්‍ර 69.3.28 සිට 69.4.15 වැනිද දක්වා ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින් අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම් වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද, නිවැරදි විය යුතු අතර, දක්වන ලද ගණන් වල සංශෝධනයන් කර තිබේනම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා සීල් තබන ලද ලියුම් කවර වල බහා ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය එවන ලියුම් කවරයේ උඩ, වම් කෙළවරේ "සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 69.4.18 පෙරවරු 9.30 ට පෙර ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටිය"ට දැමිය යුතුය.

තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාර ගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මෙ දැනුම් දීම නිකුත් කළ දින සිට, දින දහයක් ඇතුළතදී එම ටෙන්ඩර්කරු විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම් අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර් කරුට දන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නාම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

කිසිම හේතුවක් නොදන්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව, කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමක් සමග හෝ නම් ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත්යැයි හැගෙන හේතූන් උඩ, ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධව වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කායර්‍යාලීය වේලාවන් තුළදී සැළසුම් පරීක්ෂා කර බැලීමට ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා, ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලිමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කායර්‍යාලීය වේලාවන් තුළදී ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලා පොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරා වෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනීසිටින, ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත්වියයුතු ය. ''ගොවිජන සේවාසහකාර කොමසාරිස්'' යනු වන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරි තැනය. ගිවිසුම්පත්‍රයේ අඩංගුවිය යුතු මුද්දරය කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

ගාලු දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියෙකු විසින් 69.4.18 වනද පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් ටෙන්ඩර්පත්‍ර වල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඒ. ඒ. ද සිල්වා,
ගොවිජනසේවා සහකාර කොමසාරිස්,
ගාලු දිස්ත්‍රික්කය.

69.3.15 වනද,
ගාලු දිස්ත්‍රික්කයේ,
ගොවිජනසේවා කායර්‍යාලයේදීය.

3–1138—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පහත සඳහන් ස්ථානයන්හි විදුලිබල පෝෂ කර්මාන්ත ශාලාවල විශ්‍රාම කාමරය ඉදිකිරීම සඳහා කොළඹ 7, වෙරිංටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1969 අප්‍රේල් මස 17 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ:—

(1) මාදම්පේ
(2) කුරුවිට
(3) අනුරාධපුරය
(4) කැකිරාව
(5) කුරුණෑගල

2. යම්කිසි දෙපාර්තමේන්තුවක රු. 25,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචිවී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගිවිය හැක.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් එක් වැඩකට රු. 100 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1969 අප්‍රේල් 15 දින පෙරවරු 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත්කර ටෙන්ඩර් පත් ලබාගත යුතු වේ.

පී. එච්. පී. ද සිල්වා,
අධ්‍යක්ෂක,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

යොමුව : ඩීඒ/ඩී/185, ඩීඒ/ඩී/186,
ඩීඒ/ඩී/187, ඩීඒ/ඩී/188, ඩීඒ/ඩී/189.

1969 මාර්තු මස 19 දින,
කොළඹ 7.

3–1130—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## කිරි මණ්ඩලයීය උකුකිරි කර්මාන්ත ශාලාව

### ටෙන්ඩර් දැන්වීමයි

වෙන්නලාඩි මධ්‍යස්ථාන භූමියේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් හා මධ්‍යස්ථාන සහකාර නිවාසයක් ඉදිරිකිරීම පිණිස මුද්‍රා තබනු ලැබූ ටෙන්ඩර්පත් උකුකිරි කර්මාන්තශාලාවේ සාමාන්‍යාධිකාරී විසින් භාරගනු ලැබේ. එසේ භාරගැනීමට එවන ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය.

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් දෙපාර්තමේන්තුවක හෝ රජය මෙහෙයවන සංස්ථාවක හෝ මණ්ඩලයක හෝ රුපියල් 1,50,000 කට අධික වටිනාකමකින් යුතු ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටින නිර්වාහජ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍රිකා කොළඹ 8, කුරුප්පු පාරේ අංක 36/1 දරණ ස්ථානයේ උකුකිරි කර්මාන්ත ශාලාවේ සාමාන්‍යාධිකාරීගේ කායර්‍යාලය මගින් 1969 අප්‍රේල් මස 14 වැනිදා අපරභාග 3 දක්වා නිකුත් කෙරේ. ටෙන්ඩර්පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචි කිරීම හා තැන්පත් මුදල වශයෙන් රු. 250 ක මුදලක් තබන්නාවූ අයදුම්කරුවන්ටය. මෙකී මුදලින් රු. 25 ක මුදලක් ආපසු ගෙවනු නොලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා භාර ගැනීම 1969 අප්‍රේල් 15 වැනි දින දහවල් 12 ට අවසන් වේ.

සාමාන්‍යාධිකාරී,
උකුකිරි කර්මාන්ත ශාලාව.

36/1, කුරුප්පු පාර,
තැ. පෙ. 1671,
කොළඹ 8.
1969 මාර්තු 20 වැනිදා.

3–1151—69.3.28 දින අංක 14,487 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### බොරලැස්ගමුව, මැටි ශුද්ධාගාරයට දෙදියවල මැටි සැපයීම

කළුතර දිස්ත්‍රික්කයේ, දෙදියවල, පුරන පෙදෙසින් කණින ලද මැටි සැපයීම සඳහා ඉදිරිපත් කරනු ලබන සීල් තැබූ ටෙන්ඩර්පත්, සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තැන විසින් 1969 අප්‍රේල් මස 7 වෙනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

පහත සඳහන් පරිදි ගෙවීම්, මුදලින් සිදුකිරීමෙන් පසු, 1969.4.5 දින දහවල් 12 දක්වා, ටෙන්ඩර් කොන්දේසි හා ටෙන්ඩර් ආකෘති පත් ලබාගත හැක.

ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල — රු. 100
ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව ... රු. 10

සැපයීම් නිලධාරි,
ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් සහ වාප්පු දෙපාර්තමේන්තුව,
අංක 55, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 7.

3–1178—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 මැයි 1 වැනිද සිට 1969 සැප්තැම්බර් 30 වැනිද දක්වා (දින දෙකම ඇතුලුව) කාලය තුල මේ සමඟ ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයින්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර රත්නපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධසේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කල යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කලුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, මහනුවර සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී වරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරණ ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කම් විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදීත් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදීත් ටෙන්ඩර් අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝරම ඉහත සඳහන් 2 වන ඡේදයේ (ii) වැනි කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, රත්නපුර" කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචිකල තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව හෝ ගණකාධිකාරී/ ලේකම් තැනට බාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හිදී පෙ.ව. 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන්වූ වහාම මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත්‍ර තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයේ "සී" උපලේඛනයට වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් නම් ඒවා පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරණ ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරු විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත් කරුවන්ගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර්කරු විසින් සැළකිය යුතුය.

වෛද්‍ය එස්. ජී. කුලතිලක,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරී.

1969.3.16 වැනි දින,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

### උපලේඛනය

| | ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාලු | මස් | කරවල | එළවලු | නොගෙවන රෝගීන්ට: මාලු | මස් | කරවල | එළවලු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | කල්තොට රෝහල | 100 | 600 | 1969. 4.20 | — | 350 | 700 | 1,350 | — | 475 | 900 | 1,800 |
| 2. | නිවිතිගල මා.නි. | 100 | 400 | එම | — | 250 | 550 | 1,100 | — | 200 | 350 | 850 |

3-1162—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි ප්‍රවාහණය

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයන් සහ සේවා.**—වර්ෂ 1969 මැයි 5 වැනිද සිට 1969 සැප්තැම්බර් මස 30 වන දින දක්වා (ඒදිනම ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ආයතන යන්හි පිහිටි කිරි මධ්‍යස්ථානවලට එම සෞඛ්‍ය කාර්යාලවල සිට එළකිරි ප්‍රවාහණය සඳහා ලාංකිකයන්ගෙන් හා ලාංකික වෙළඳ සමාගම් වලින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතර සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රු. 100 ක මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දින දවල් 12 වන තුරු මෙම කාර්යාලයේ හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, ගාල්ල, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාල වලින් හෝ ලබා ගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කල බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය එම අල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ දිනට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට කැමැති සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වූවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගැනීමට හැකිය. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දක්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යායුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි තුන්වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, මාතර'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කලයුතුවාක් මෙන්ම, එහි වම්පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරි තැනට දීමෙන් එය ලැබුනු බවට කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කල තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන ඡේදයේ සඳහන්වන දින පෙ. ව. 10 ට ටෙන්ඩර පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් රුපියල් දෙසියයක ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කල යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

දෙස්තර අයි. ඒ. එස්. සිරිවර්ධන,
මාතර, සෞ. සේ. අධිකාරී.

1969 මාර්තු මස 21 දිනදී,
මාතර සෞ. සේ. අධිකාරි කාර්යාලයේදිය.

### උපලේඛනය

| 1<br>සේවය | 2<br>ප්‍රදේශය | 3<br>ප්‍රමාණය පයින්ට් (මසකට) | 4<br>අවසාන දිනය |
|---|---|---|---|
| මාතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සිට එකී කොට්ඨාශයේ කිරි මධ්‍යස්ථාන වලට එළකිරි ප්‍රවාහණය | මාතර ... | 3,600 ... | 1969.4.22 |

3–1048—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කොළඹ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මත්තුමගල ජනපදයේ පාර සහ බෝක්කු සෑදීම සඳහා 1969 අප්‍රේල් මස 17 දින දහවල් 12 දක්වා කොළඹ දිසාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අප්‍රේල් මස 15 දින දවල් 12 දක්වා කොළඹ දිසාපති විසින් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයා විසින් රු. 25 ක් ඕනෑම කච්චේරියක හෝ මහ භාණ්ඩාගාරයේ තැන්පත් කළ කුවිතාන්සියක් ඉදිරිපත් කර ටෙන්ඩර් පෝර්ම කොළඹ දිසාපති කාර්යාලයෙන් ලබාගත යුතුය.

4. දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදියටද ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අතර එවැනි සමිති ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට නියමිත තැන්පත් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු අතර එවැනි සමිතිවලින් ටෙන්ඩරය සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් බැඳීමෙන් නිදහස්ය.

5. පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර වම් පස "මත්තුමගල ජනපදයේ පාර සහ බෝක්කු" යනුවෙන් සඳහන් කවරයක දමා ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර තැපැලෙන් නො එවන්නේ නම් කොළඹ දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

6. 1969 අප්‍රේල් මස 17 දින පෙරවරු 12 ට කොළඹ දිසාපති කාර්යාලයේ උප දිසාපති තුමාගේ කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අතර එකී වේලාවට ටෙන්ඩර්කරුවන්ට හෝ නියෝජිතයින්ට හෝ පැමිණ සිටිය හැක.

7. වැඩි විස්තර කොළඹ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබා ගත හැක.

සී. ජී. පල්ලියගුරු,
කොළඹ දිසාපති වෙනුවට.

1969.3.18 දින,
කොළඹ කච්චේරියේ දී ය.

3–1240—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ගාලු වරායට අඟල් 2, අඟල් $1\frac{1}{2}$ සහ අඟල් $\frac{3}{4}$ කෑලිගල් සැපයීම

ගාලු වරායේ වැඩ කටයුතු සඳහා අඟල් 2 කෑලිගල් කියුබ් 700, අඟල් $1\frac{1}{2}$ කෑලිගල් කියුබ් 100 ක් සහ අඟල් $\frac{3}{4}$ කෑලිගල් කියුබ් 400 ක් ලබාගැනීමට අවශ්‍ය වී ඇත. එබැවින් අඟල් 2 කෑලිගල් කියුබ් එකක් රු. 70 බැගින්, අඟල් $1\frac{1}{2}$ කෑලිගල් කියුබ් එකක් රු. 66 බැගින් හා අඟල් $\frac{3}{4}$ කෑලිගල් කියුබ් එකක් රු. 80 බැගින් ගාලුවරායේ නේවාසික ඉංජිනේරුතුමා වෙත ගෙනවිත් භාරදිය හැකි අයවළුන්ගෙන් ඔවුන්ට සැපයිය හැකි කෑලිගල් ඒ ඒ ප්‍රමාණයන් හා ඒ සඳහා අවශ්‍ය කාලවේලාවන් ආදිය සඳහන් කොට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ.

මේසේ එවන අයදුම් පත් 1969 අප්‍රේල් මස 10 වෙනි දිනට පෙර වරාය කොමසාරිස්තුමා, කොළඹ වරාය කොමිෂන් සභාව, කොළඹ 1 යන ලිපිනයට ලියාපදිංචි කරන ලද තැපැලෙන් එවනු මැනවි.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාවේදීය.
69. 3. 20.

3–1244—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## ටෙන්ඩර් දැන්වීමයි—විදුලිය

### ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළපාරේ අංක 200 දරණ ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන කාර්යාලයෙහි නියුක්ත ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් කර්මාන්තය සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1969 අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් භාර ගනු ලැබේ.

(1) කතරගම

නව ඩිපෝ ගොඩනැගිලිවල විදුලි උපකරණ සපයා සවි කිරීම

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනුපිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳ අවශ්‍ය සියලු විස්තර සහ තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර අදාල සැලසුම් පත් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල විදුලි ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 60,000 කට නො අඩු ගණනකට ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත් කරුවන් පමණක් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සන් වන අතර ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමත කළහොත් පමණක් නියමිත ටෙන්ඩර් ඇප මුදල මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත 1969 අප්‍රේල් මස 14 වෙනි සඳුදා මධ්‍යහ්න 12 ට ප්‍රථම ඉදිරිපත් කිරීමෙන් පසු අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම යනාදිය ලබා ගත හැක.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන.

3–1204—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනා ගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ නො. 200 දරණ ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති තැන විසින් මෘදු සබන් සහ ටී පෝල් හෝ සමාන ද්‍රව්‍යයක් සැපයීම සඳහා 1969 ක්වූ අප්‍රේල් මස 18 වෙනි දින පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත ලෙස ලියා අනු පිටපතකින් ද යුක්තව සකස් කොට එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන්නේ කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වැනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ටෙන්ඩරය වෙනුවට රු. 100 ක මුදලක් තැන්පත් කළ විටය. ඉහත සඳහන් දිනට පෙර දින දහවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා වන ගෙවීම් වවුචර් පත්‍රිකා මගේ කාර්යාලයෙන් ලබාගත යුතුය.

මේ ටෙන්ඩරය සම්බන්ධ වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

ලංකා ගමනාගමන මණ්ඩලීය සම්පාදක කොට්ඨාශ මූලස්ථානය,
නො. 200, කිරුළ පාර,
කොළඹ 5,
1969 ක්වූ මාර්තු මස 19 වෙනි දින.

3–1205—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩ කරවා ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම

වෂී 1969 අප්‍රේල් මස 25 වෙනි දින පස්වරු 2.30 දක්වා මෙහි පහත සඳහන් වැඩ සඳහා කොළඹ 1, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර්මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

(i) හබුඩුගල ජනපද පාරට තාර දැමීම,

(ii) සපුමල්කන්ද ජනපද පාර තැනීම

2. ටෙන්ඩර්පත්‍ර කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් ගාලුමුවදොර මහලේකම් කාර්යාලයේ 3 වෙනි මාලයේ අංක 357 දරන කාමරයේ තබා ඇති පෙට්ටියේ බහාලිය යුතුයි.

3. ටෙන්ඩර්පත්‍ර කෑගල්ලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් 1969 අප්‍රේල් මස 25 දින පෙ. ව. 11.30 වන තෙක් ලබා ගත හැක. මෙසේ ලබා ගන්නා ටෙන්ඩර් ෆෝර්ම හැර වෙනත් ෆෝර්ම වලින් ඉදිරිපත් කරන ටෙන්ඩර්පත්‍ර හා ටෙන්ඩර් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසිවලට අනුකූල නොවන ටෙනඩර්පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ ඉඩම් කොමසාරිස් කාර්යාලයේ හෝ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ෆෝර්ම පිටපත් දෙකකින් යුතුව එවිය යුතු අතර, එසේ එවනු ලබන ටෙන්ඩර්පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතුයි.

5. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැබිය යුතුයි. එසේම ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බවට දැනුම් දීමෙන් දින හතක් අතුළත දී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම්ව සිටිය යුතුයි. ටෙන්ඩරය බාරගත් බව සඳහන් වන ලියවිල්ල ඔහුට පුද්ගලිකව බාරදීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බැව් දැන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දැනුම් දීමෙන් පසුව ගිවිසුම්පත්‍රය අත්සන් තැබීම අතපසු කළහොත් හෝ ප්‍රතික්ෂෙප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. කෑගල්ලේ දිසාපතිතැනගේ අවසරයක් නොලබා වැඩ ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ බාරදීමට හෝ පුළුවන්කමක් නැත. එසේම පත්කරනු ලබන ටෙන්ඩර්කරු වැඩය කරන ප්‍රදේශයෙන් අවශ්‍යතාවයේ හැටියට පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් සේවය සඳහා යෙදවිය යුතුයි.

8. ලියාපදිංචි සමූපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති, වාරිමාර්ග, රජයේ වැඩ, දුම්රිය, ඉඩම් කොමසාරිස් හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා ලියාපදිංචි වී ඇති (රු. 50,000) දක්වා කොන්ත්‍රාත් කරුවන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

9. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය නම් කෑගල්ලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබා ගත හැක.

කෑගල්ලේ දිසාපති වෙනුවට.

1969 මාර්තු 19 දින,
කෑගල්ලේ කච්චේරියේදීය.

3–1164—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ඇහැටුවැව ග්‍රාමීය ආරෝග්‍යශාලාවට ඇඳන් 12 ක වාට්ටුවක් තැනීම සඳහා වූ ටෙන්ඩර් පත් ර. වැ. දෙ. කුරුණෑගල, අධිකාරී, ඉංජිනේරු කාර්යාලයෙහි ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 27 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මහව රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉන්ජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියළු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැළැස්ම ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 52,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉන්ජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන, රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක දී හෝ තැන්පත් කළ හැක.

ඇස්. ගණේෂරත්නම්,
අධිකාරි ඉන්ජිනේරු, වයඹ කොට්ඨාශය,
කුරුණෑගල.

කුරුණෑගල,
අධිකාරි ඉන්ජිනේරු කාර්යාලය.

2–1149—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### දකුණු ප්‍රදේශයට අයත් ප්‍රදේශයන්ගෙන් සිල්පර, විදුලි සම්ප්‍රේක්ෂණ කණු හා කඳන් සැපයීම

පහත සඳහන් ප්‍රදේශවලින් එහි දැක්වෙන වටිනාකමට සිල්පර, විදුලි සම්ප්‍රේක්ෂණ කණු හා කඳන් සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රජයේ හෝ සංස්ථාවල ලියාපදිංචි වූ I සහ II පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්වල වටිනාකමට වත්කම් සහතික ඉදිරිපත් කළහැකි අනෙක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

#### ප්‍රදේශය

(i) පත්තිල් කන්ද අංක 3 කොටස. සිල්පර, විදුලි සම්ප්‍රේක්ෂණ කණු හා කඳන් සඳහා රු. 1,00,000 වටිනාකමට.
(ii) මුලටියන රක්ෂිතය අංක 19 කොටස. සිල්පර, විදුලි සම්ප්‍රේක්ෂණ කණු හා කඳන් සැපයීම සඳහා රු. 1,50,000 වටිනාකමට.
(iii) දියදව අංක 8 කොටස. සිල්පර සහ කඳන් සැපයීම සඳහා රු. 40,000ක වටිනාකම.
(iv) දියදාව අංක 21 කොටස. සිල්පර සහ කඳන් සැපයීම සඳහා රු. 70,000ක වටිනාකමට.
(v) දියදාව අංක 2 කොටස. සිල්පර සහ කඳන් සැපයීම සඳහා රු. 75,000 ක වටිනාකමට.
(vi) ලුණු ගං වෙහෙර ජලාශ ක්‍රමය අංක II කොටස. කඳන් සැපයීම සඳහා රු. 25,000 වටිනාකමට.

2. 1969. 4. 18 වැනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලැබේ.

3. 1969. 4. 19 වැනි දින පෙරවරු 11ට ටෙන්ඩර්පත් බාර ගැනීම අවසන් කරනු ඇත.

වැඩි විස්තර දකුණු ප්‍රදේශයේ රාජ්‍ය දැව සංස්ථාවේ මාතර ප්‍රාදේශීය කළමනාකරුගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265, දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. ඩී. ආර්. රත්නරාජා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.
රාජ්‍ය දැව සංස්ථාව.

1969 මාර්තු 19 වැනි දින,,
ක්‍රියකාරී කළමනාකරුගේ අංශය,
රාජ්‍ය දැව සංස්ථාව,
265, තිඹිරිගස්යාය පාර,
කොළඹ 5.

2–1238/1—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### අනුරාධපුර ප්‍රදේශයට අයත් ප්‍රදේශයන්ගෙන් කඳන් සැපයීම

පහත සඳහන් ප්‍රදේශවලින් එහි දැක්වෙන වටිනාකමට සිල්පර හා කඳන් සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265, දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රජයේ හෝ සංස්ථාවල ලියාපදිංචි වූ I සහ II වන පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්තුවල වටිනාකමට වත්කම් සහතික ඉදිරිපත් කළහැකි අනෙක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

#### ප්‍රදේශය

(i) පන්කුලම් යෝජිත රක්ෂිතය—අංක 1 කොටස කඳන් සැපයීම සඳහා රු. 50,000 වටිනාකමට.
(ii) පන්කුලම් යෝජිත රක්ෂිතය අංක 2 කොටස කඳන් සැපයීම සඳහා රු. 50,000 වටිනාකමට.

2. 1969. 4. 18 වැනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරනු ලැබේ.

3. 1969. 4. 19 වැනි දින පෙරවරු 11ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරනු ඇත.

වැඩි විස්තර යාපනයේ, රාජ්‍ය දැව සංස්ථාවේ, අනුරාධපුර ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකරුගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබා ගත හැකිය.

ඒ. ඩී. ආර්. රත්නරාජා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.
රාජ්‍ය දැව සංස්ථාව.

1969 මාර්තු 19 වැනි දින,
ක්‍රියාකාරී කළමනාකරුගේ අංශය,
රාජ්‍ය දැව සංස්ථාව,
265, තිඹිරිගස්යාය පාර,
කොළඹ 5.

2–1238/2—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංසථාව

### නුවර ප්‍රදේශයට අයත් දඹුරුඹය යෝජනා ක්‍රමයට යටවන යෝජිත රක්ෂිත කැලෑවල දැව ඉවත් කිරීම

දඹුරුඹය යෝජනා ක්‍රමයට යටවන පහත සඳහන් ප්‍රදේශවලින් එක් එක් ප්‍රදේශයෙන් රු. 5,000ක වටිනාකමට කඳන් සැපයීම සහ ගබඩාවනට සපයනු තොළඹන් දර සහ රවුන් කණු විකිණීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකරුගේ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රජයේ හා සංස්ථාවල ලියාපදිංචි වූ I සහ II පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්වල වටිනාකමට වත්කම් සහතික ඉදිරිපත් කළ හැකි. අනික් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

#### ප්‍රදේශය

(i) මිතිවන්ගැටේ යෝජිත රක්ෂිතය ;
(ii) පොතුවැව යෝජිත රක්ෂිතය ;
(iii) ඉගේනගම යෝජිත රක්ෂිතය ;
(iv) තිඹිරිවැව යෝජිත රක්ෂිතය ;
(v) පන්වැව යෝජිත රක්ෂිතය.

2. 1969. 4. 18 වැනි දින අ. භා. 2 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ඇත.

3. 1969.4.19 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරනු ඇත.

වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ මහනුවර ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකරුගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265, දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබා ගත හැකිය.

ඒ. ඩී. ආර්. රත්නරාජා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.
රාජ්‍ය දැව සංස්ථාව.

1969 මාර්තු 19 වැනි දින,
ක්‍රියාකාරී කළමනාකරුගේ අංශය,
රාජ්‍ය දැව සංස්ථාව,
265, තිඹිරිගස්යාය පාර,
කොළඹ 5.

2–1238/3—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

උපලේඛනයේ සඳහන් මිල අනුව අඟල් ½ කලුගල් කියුබ් 111ක් කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව පාරට සැපයීම සඳහා වූ ටෙන්ඩර් පත්, නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 23 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. කල්මුනේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 16,000කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

6. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය ටෙන්ඩර් තැන්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කර ගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘතිපත්‍ර නිකුත් කරන නිළධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුයි.

ටී. බී. පී. සමරවික්‍රම,
අධිකාරි ඉංජිනේරු.

අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
1969.3.15.

3–1196—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය.

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

අම්පාරේ ර. වැ. දෙ කායඕලය, ගරාජය, ගබඩාව, වැඩපොල, සංචාරක කාමරය සහ වෙඩි බෙහෙත් ගබඩාව තැනීම සඳහා වූ ටෙන්ඩර්පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඕලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 27 වැනි ඉරිදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. අම්පාරේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළයුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කායඕලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,85,000කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කර ගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඕලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර. වැ.දෙ ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1.
1969.3.21.

3–1242—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1968 දෙසැම්බර් හා 1969 ජනවාරි, පෙබරවාරි මාස සඳහා ටෙන්ඩර් පිළිබඳ අවසාන තීරණ**

| සේවා විස්තර | ටෙන්ඩර් ගණන | | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1. දඹුල්ලේ ඉ.සං.දෙ. ගබඩාවේ සේවයට නුසුදුසු මෝටර් අමතර කොටස් විකිණීම | 2 | ... | ශාන්ත ජේම්ස් හාඩ්වෙයාර් ස්ටෝර්ස්, 703 ඊ, වේල්ස් කුමාර වීදිය, කොළඹ 14 | 367 | 0 |
| 2. මුක්තයයන්කච්චුකුලම්හි ක්‍රම නිෂ්පාදන කාර්යාලයේ විදුලි ස්ථාපනය කිරීම සඳහා වූ ටෙන්ඩරය | 4 | ... | ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරන ලදී | | |
| **1969 ජනවාරි** | | | | | |
| 1. අක්කරායන්කුලම රෝහලේ සුළු සේවක නිවාස 8ක හා මහජන සෞඛ්‍ය පරික්ෂක නිවාසයේ විදුලි ස්ථාපනය කිරීම සඳහා වූ ටෙන්ඩරය | 7 | ... | ආර්. ඩී. ඇෆ්ජ්. ප්‍රනාන්දු මහතා, 94, වැබඩ පාර, මීගමුව | 7,150 | 0 |
| 2. මුත්තයයන්කච්චුකුලම්හි ක්‍රම නිෂ්පාදන කාර්යාලයේ විදුලි ස්ථාපනය කිරීම සඳහාවූ ටෙන්ඩරය | 4 | ... | ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරන ලදී | | |

**1969 පෙබරවාරි**

තීරණ නැත.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

එච්ලන් චතුරශ්‍රය,
කොළඹ, 1969.3.16.

3–1221 —69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය.

# බඩු බාහිරාදිය විකිණීම්

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින්, වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උප ලේඛනයේ දක්වෙන ස්ථානවලදී සහ දිනවලදී පෙ.ව. 9.30 ට සිදුකරනු ලැබේ.

2. උප ලේඛනයේ සඳහන් ස්ථානයන්හිදී මෙම එන්ජින් පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත දක්වෙන පරිදි මුදලින්ම කළ යුතුය :—

(අ) යාත්‍රාවේ විකුණුම් මිළෙන් ¼ ක් විකිණීම අවසන් වූ වහාම,

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3 ක් ඇතුළත දී.

4. වෙන්දේසියේ විකුණන ලද එන්ජින් මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යනතෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමිභාගයෙහිම තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| — ... | අ.බ. 8 යන්මාර් ... | අයිස් කර්මාන්ත ශාලාව පේසාලේ | 69. 4.17 |
| — ... | ලිස්ටර් එච්.ඒ. 2 ... | පවර්ක්‍රාෆ්ට් යාත්‍රාංගනය | 69. 4.20 |
| — ... | එම ... | එම ... | එම |
| — ... | අ.බ. 16 පෙටර් ... | එම ... | එම |
| — ... | අ.බ. 22 බුක් ... | එම ... | එම |
| — ... | අ.බ. 16 යන්මාර් ... | එම ... | එම |
| — ... | අ.බ. 8 කුබෝටා ... | ධීවර කාර්‍යාලය, පේදුරුතුඩුව | 69. 4.21 |
| — ... | ඇලිසා ග්‍රෙග් ... | එම ... | එම |
| — ... | ලිස්ටර් එච්.ඒ. 2 ... | එම ... | එම |
| ඊ. 99 ... | බුක් සිලින්ඩර් 2 ... | එම ... | එම |
| එස්අයිසී. 102 ... | ටෝර්පිඩෝ ... | ධීවර කාර්‍යාලය, මුලතිව් | 69. 4.23 |
| — ... | අ.බ. 18 කුබෝටා ... | ධීවර කාර්‍යාලය, තාලයාඩි | 69. 4.22 |
| — ... | බුක් සිලින්ඩර් 2 ... | එම ... | එම |
| ඩබ්. 22 ... | අ.බ. 16 යන්මාර් ... | ධීවර කාර්‍යාලය, වාලච්චේනේ | 69. 4.25 |
| ජේපිඇෆ්ජ. 53 ... | ඇලිසා ග්‍රෙග් ... | ධීවර කාර්‍යාලය, වෙන්කලාඩි | 69. 4.26 |
| ඊ. 48 ... | අ.බ. 8 යන්මාර් ... | ධීවර කාර්‍යාලය. මඩකලපුව | 69. 4.22 |
| — ... | ලිස්ටර් එස්එල්. 3 ... | ජේපිඇජ්. යාත්‍රාංගනය, මීගමුව | 69. 4.17 |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 මාර්තු මස 20 වැනිද,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

3–1199—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### ඇන්ජින් සහිත වූ/රහිත වූ/පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා වෙන්දේසියේ විකිණීම

ඇන්ජින් සහිත වූ/රහිත වූ ටොන් 3½ රේ පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා පහත සඳහන් උප ලේඛනයෙහි දක්වෙන දිනයන් හිදී සහ ස්ථානයන් හිදී පෙ.ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උප ලේඛනයෙහි සඳහන් ස්ථානයේදී මෙම යාත්‍රා පරීක්ෂාකර බැලිය හැකිය. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින් ම කළ යුතුය :—

(අ) යාත්‍රාවේ විකුණුම් මිළෙන් ¼ ක් විකිණීම අවසන් වූ වහාම,

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3 ක් ඇතුළත දී.

වෙන්දේසියේ විකුණන ලද යාත්‍රා මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යනතෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමි භාගයෙහි තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ඊ. 93 ... | — | ... මඩකාලි, මඩකලපුව | 69. 4.17 |
| ඊ. 418 ... | අ.බ. 31 බුක් (බ්ලොක් එක පමණි) | ... පුන්නකුඩා වෙරළ | 69. 4.19 |
| ඊ. 358 ... | — | ... පුන්නකුඩා වෙරළ | 69. 4.19 |
| ඊ.එස්. 48 ... | අ.බ.22 ලිස්ටර් | ... පෙතලායි, වාලච්චේනෙයි | 69. 4.20 |
| එස්. 172 ... | — | ... බේරුවල ... | 69. 4.17 |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 මාර්තු මස 20 වැනි දින,
කොළඹ ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

3–1200—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය

ගල්ගමුව අඩවියේ වන අපරාධ වලට අයත් හල්මිල්ල, බුරුත, ඇහල, ගොඩකිරිල්ල වැවරන ආදියෙන් සමන්විත ඝන අඩි 577.2 කින් යුත් කඳන් 62 ක් හා 1 වෙනි පන්තියේ කනු 20 ක් 1969 අප්‍රේල් මස 3 දින පෙරවරු 10 ට ගල්ගමුව අඩවි කැලෑ කාර්යාලයේ දී වයඹ දිසා කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර දැව පරීක්ෂා කර බැලිය හැක.

3. වැඩි විස්තර සඳහා ගල්ගමුව අඩවි කැලෑ නිලධාරි හෝ වයඹ දිසාකැලෑ නිලධාරි හෝ විමසන්න.

ඊ. සී. ද ඉසෙඩ් වීරවර්ධන,
වයඹ දිසාභාර කැලෑ නිලධාරි,
කුරුණෑගල.

1969 මාර්තු මස 15 දින,
කුරුණෑගල දිසාකැලෑ කාර්යාලයේ දී.

3–1169—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විකිණීම

ප්‍රයෝජනයට ගත නොහැකි සපත්තු, බූට්ස්, ඇල තොප්පි, වැහි කබා ආදිය වෙන්දේසියේ විකිණීමක් 1969 අප්‍රේල් 1 දින පෙරවරු 10 යේ පටන් රත්නපුර පොලිස් ස්ථානයේ පැවැත්වේ. වෙන්දේසිය පටන් ගැනීමට පෙර මෙම භාණ්ඩ ගැනුම්කරුවන්ට රත්නපුර පොලිස් ස්ථානයේ දී පරීක්ෂා කිරීමට හැක. ජයග්‍රාහී ඉල්ලුම් කරුවන් විසින් වෙන්දේසිය අවසන් වූ වහාම භාණ්ඩවල වටිනාකම මුදලින් ගෙවා ඔවුන් මිලදී ගත් භාණ්ඩ ඉවත් කරගත යුතුයි.

හ. වෙ. ෆෙ. වීරසිංහ,
පොලිස් අධිකාරී, සබරගමුව.

පොලිස් කාර්යාලය,
රත්නපුරය,
1969 මාර්තු 14 දින.

3–1129—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## රේගුවේ ඔරලෝසු වෙන්දේසිය

පහත සඳහන් ඔරලෝසු 1969 අප්‍රේල් මස 8 වෙනි අඟහරුවාදා පෙ. ව. 9 ට රේගුවේ පයසීන්ත ගොඩනැගිල්ලේදී වෙන්දේසියෙන් විකුණනු ලැබේ. 1969 අප්‍රේල් 7 වෙනි දින පෙ. ව. 9.30 සිට ප. ව. 12.30 දක්වා ද ප. ව. 1.30 සිට ප. ව. 4 දක්වා ද රේගුවේ ගාස්තු නිලධාරීන්ගේ කායසීලයේ දී ප්‍රදර්ශනය කැරෙනු ඇත:—

ෆාවේ (ලුබා) අත් ඔරලෝසු 90ක්.
සෙයිකෝ (පුරුෂ) අත් ඔරලෝසු 10ක්.
සෙයිකෝ (ස්ත්‍රී) අත් ඔරලෝසු 6ක්.
ඔමිගා කොන්ස්ටලේෂන් ඔරලෝසු 1ක්.
ඔමිගා ස්ත්‍රී අත් ඔරලෝසු 1ක්.
රෝමර් අත් ඔරලෝසු 1ක්.
සිගරැට් ලයිටරයක බැඳි ඔරලෝසුවක් (ෆෙවර්).
නෙල්සන් ස්ත්‍රී අත් ඔරලෝසුවක්.
හෙන්රි සැන්ඩෝස් සහ ෆිලිප්ස් අත් ඔරලෝසු 2ක්.
රෝබ් (ස්ත්‍රී) අත් ඔරලෝසුවක්.
රැලා (ස්ත්‍රී) අත් ඔරලෝසු 3ක්.
රැලා (පුරුෂ) අත් ඔරලෝසු 2ක්.
පොල්ජෝට් අත් ඔරලෝසු 1ක්.
විටෝනි ස්ත්‍රී අත් ඔරලෝසු 1ක්.
ලුසිනා අත් ඔරලෝසු 1ක්.
කෝනි (ස්ත්‍රී) අත් ඔරලෝසු 1ක්.
කෝනි ප්‍රීමා (ස්ත්‍රී) අත් ඔරලෝසු 1ක්.
ඩොනාඩා (ස්ත්‍රී) අත් ඔරලෝසු 1ක්.
ජංහම්ස් අත් ඔරලෝසු 1ක්.
ෆෙරෙක්ස් ස්ත්‍රී අත් ඔරලෝසු 1ක්.
ඕරිස් ස්ත්‍රී අත් ඔරලෝසු 2ක්.
ඩොම් ස්ත්‍රී අත් ඔරලෝසු 1ක්.
එනිකා ස්ත්‍රී අත් ඔරලෝසු 3ක්.

බදු භාරදෙන අවස්ථාවේ දී අයකැමි වෙත ආකෘති පත්‍රයක දෙනු ලබන වගකීම්කරයක් අනුව නැවත නොවිකිණීම හා අන් අයුරකින් වෙනත් අයකු සතු නොකිරීම හා යන නියග එකඟත්වයට යටත්ව, මේ ඔරලෝසු විකුණනු ඇත. ගැණුම් කරුවෙත නිකුත් කරන ලබන කුවිතාන්සියේ "නැවත විකිණීම හෝ අයිතිය පැවරීම හෝ සඳහා වලංගු නොවේ" යැයි සඳහන් කරනු ඇත.

පුද්ගලයන් සඳහා පමණක් ලංසු බාරගන්නා අතර එක් අයකු හට එක ඔරලෝසුවක් පමණක් ලබා ගැනීමට හිමිකම් ඇත. සාප්පු හෝ සමාගම් වෙනුවෙන් ඉදිරිපත් කරන ලංසු භාර නොගැනෙයි. වෙන්දේසියට නොපැමිණියකු වෙනුවෙන් ද ලංසු භාර නොගනු ඇත.

අවසාන ලංසුව අනුව අලෙවි මිළ ප්‍රමාණවත් වන්නේ යැයි අයකැමි එත්තු ගන්නේ නම් එක් එක් විකිණීම අවසානයේ දී සම්පූර්ණ මුදල ගෙවීමෙන් බඩු ඉවත් කරගත හැක.

සම්පූර්ණ විස්තර ඇති ලැයිස්තු රේගුවේ ගාස්තු නිලධාරිගෙන් ලබා ගත හැක.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

බී. ඕ. 148—1/69,
ගමන් බඩු කායසීලය,
කොළඹ 1.

3–1241—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## වැඩ ගත නොහැකි දේවල් වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් දේවල් කොළඹ, සෙනේට් මන්දිරයේ කැබිනට් කාර්යාලයේ දී 1969 අප්‍රේල් මස 15 වැනි අඟහරුවාදා පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය අවසන් වූ වහාම එම දේවල් මුදල් ගෙවා ගෙන යා යුතුයි.

| ප්‍රකාශන | | | රාත්තල් |
|---|---|---|---|
| ප්‍රවෘත්ති පත්‍ර (සිංහල හා ඉංග්‍රීසි) | ... | ... | 100 |
| පරණ ගැසට් පත්‍ර ... | ... | ... | 22 |
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ න්‍යාය පත්‍ර, කාර්ය සටහන් හා පාර්ලිමේන්තු විවාද | ... | ... | 42 |
| විවිධ පත්‍ර ... | ... | ... | 50 |

| | | | පිටපත් |
|---|---|---|---|
| ෆර්ගසන් සිරෙක්ටරි | ... | ... | 2 |
| පරණ මුද්‍රිත ඇස්තමේන්තු | ... | ... | 72 |
| ලංකා රේගු වාර්තා ... | ... | ... | 4 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරනිකා (සිංහල හා ඉංග්‍රීසි) | | ... | 16 |
| ෆාර් ඊස්ට් ට්‍රේඩ් ... | ... | ... | 8 |

ඒ. එස්. කෝහොඹන්-වික්‍රම,
කැබිනට් මණ්ඩලයේ ලේකම්.

1969 මාර්තු මස 17 වැනි දින,
කොළඹ, කැබිනට් කාර්යාලයේ දී ය.

3–1131—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

**වාහන අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි ගරාජයන් සහ ඉංජිනේරු වෙළඳ සමාගම් ලියා පදිංචි කිරීම**

මෙම දෙපාර්තමේන්තුවට අයත් වාහන අළුත්වැඩියා කිරීම් භාර ගැනීමට කැමති කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි ගරාජ සහ ඉංජිනේරු වෙළඳ සමාගම් ලියා පදිංචි කිරීම සඳහා අයදුම් පත් භාරගනු ලැබේ.

ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයන්හි පිළියෙල කරන ලද අයදුම්පත් 1969.4.30 වැනි දිනට පෙර ලැබෙන ලෙස කොළඹ 1, පැරණි මහලේකම් කාර්යාලයේ, ඉඩම් කොමසාරිස් වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

මේ සම්බන්ධයෙන් අංක 14,808 සහ 1968.6.28 දින දරණ ගැසට් පත්‍රයේ සහ අංක 14,818 සහ 68.9.5 දින දරණ ගැසට් පත්‍රයේද පල කරවන ලද දැන්වීම් අනුව දැනටමත් අයදුම් පත් එවා තිබෙන අය නැවත අයදුම් පත් එවීම අනවශ්‍යය.

එච්. ආර්. අමීට්,
අතිරේක ඉඩම් කොමසාරිස්.

1969.3.13,
කොළඹ 1,
ඉඩම් කොමසාරිස් කාර්යාලයේදීය.

3–1052—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

---

## තනතුරු – ඇබෑර්තු (496 පිටුව හා සම්බන්ධයි)

### රාජකීය ලංකා නාවික හමුදාව

සහකාර වැඩ මූලික (නැව් කාර්මික ශිල්පී)

අංක 14,843 හා 69.2.28 දින දරණ ගැසට් පත්‍රයේ පල වූ ඉහත සඳහන් තනතුර සඳහා වූ නිවේදනය ගැනයි.

මෙම තනතුර සඳහා අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 1969 අප්‍රේල් මස 7 දින දක්වා දීර්ඝ කරනු ලැබූ බැව් දැනුම් දෙමි.

ඊ. ආර්. සමරසේකර,
සිවිල් පාලන නිලධාරි හා ගණකාධිකාරි,
නාවික හමුදාධිපති වෙනුවට.

1969 මාර්තු මස 23 වැනි දින,
කොළඹ 1,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේදී ය.

3–1339—69.3.28 දින අංක 14,847 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වෙලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1969**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 3. 1.69 | සිකුරාද | ... | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | | 9. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 16. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 24. 1.69 | සිකුරාද | ... | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 31. 1.69 | සිකුරාද | ... | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 7. 2.69 | සිකුරාද | ... | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 14. 2.69 | සිකුරාද | ... | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 2.69 | සිකුරාද | ... | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ... | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු | ... | 7. 3.69 | සිකුරාද | ... | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 14. 3.69 | සිකුරාද | ... | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 3.69 | සිකුරාද | ... | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 28. 3.69 | සිකුරාද | ... | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 3. 4.69 | බ්‍රහස්පතින්ද | .. | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 11. 4.69 | සිකුරාද | ... | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | | 18. 4.69 | සිකුරාද | ... | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | | 25. 4.69 | සිකුරාද | ... | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 30. 4.69 | බදාදා | ... | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි | .. | 9. 5.69 | සිකුරාද | ... | 30. 4.69 | බදාදා | ප.ව. | 3.30 |
| | | 15. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 22. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 30. 5.69 | සිකුරාද | ... | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| ජූනි | ... | 6. 6.69 | සිකුරාද | ... | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 13. 6.69 | සිකුරාද | .. | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 20. 6.69 | සිකුරාද | ... | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 27. 6.69 | සිකුරාද | ... | 20. 6.69 | සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි